

සිංහාවලෝකනයේ අසිරිය අධ්‍යාත්මයක විකසනය

අති පූජනීය උඩර්රියගම ධම්මජීව ථේරාභිනන්දන

රචනය

පූජ්‍ය බණ්ඩාරවෙල සද්ධාතිස්ස හිමි

සිංහාවලෝකනයේ අසිරිය
අධ්‍යාත්මයක විකසනය

අති පූජනීය උඩර්රියගම ධම්මජීව ථේරාභිනන්දන

රචනය

පූජ්‍ය බණ්ඩාරවෙල සද්ධාතිස්ස හිමි.

ප්‍රකාශනය

මීතිරිගල නිස්සරණ වනය සංරක්ෂණ මණ්ඩලය

පටුන

1. ප්‍රවේශය

2. දඟකාර ගැමි කොලුවා

3. සරසවි වරමින් විශ්වයට ප්‍රවේශය

4. ජීවිතයේ හැරවුම් ලක්ෂයක් - කිං කුසල ගවේෂී

5. විමර්ශන හා පර්යේෂණ

6. භව ගමන කෙලවර කරන්නට -

 අනුපුබ්බ කිරියා, අනුපුබ්බ සික්ඛා, අනුපුබ්බ පටිපදා

7. සේනාසනයේ භාවනා ප්‍රතිපදාවේ නව නැම්මක්

8. ධර්ම දේශනා ප්‍රතිපත්තිය හා ප්‍රතිපදාව

9. භාවනා වැඩසටහන්

10. සති පාසල

11. කුටප්‍රාප්තිය

මීතිරිගල නිස්සරණ වනය ආරණ්‍ය සේනාසනාධිපති,
සති පාසල නිර්මාතෘ, කම්මට්ඨානාචාර්ය, අතිපූජ්‍ය
උඩඊරියගම ධම්මජීව නායක ස්වාමීන් වහන්සේ

පෙරවදන

මීතිරිගල නිස්සරණ වනය ආරණ්‍ය සේනාසනයේ ප්‍රධාන කම්මට්ඨානාචාර්ය ධුරන්ධර අති පූජනීය උඩර්රියගම ධම්මජීව මහ තෙරුන් වහන්සේ 2022 පෙබරවාරි 5 වන දිනට සිය ජීවන ගමන් මගෙහි සත්වන දසකයට පා තබයි. කමටහන් ගුරුවරයකු හා ව්‍යක්ත ප්‍රතිබල ධර්ම දේශකයානන් වහන්සේ කෙනෙකු ලෙස උන්වහන්සේ පසු ගිය දසක තුනකට අධික කාලයක් තිස්සේ දසදහස් ගණනක් දෙස් විදෙස් යෝගාවචරයන් හට සතිපට්ඨානය වඩමින් තම තමන් ලැබූ මනුස්සත්ත පටිලාභය දෙලොව සාර්ථකත්වය සඳහා යොදගැනීමට ධර්මයෙන් මෙන්ම ආදර්ශයෙන් ද උපකාර කර ඇත.

මෙම උතුම් අවස්ථාවේදී උන්වහන්සේගේ ධර්ම ශාස්ත්‍රීය සේවාව ඇගයීම සඳහා මෙම උපහාර ග්‍රන්ථය පිරිනැමීමට ලැබීම සතුටට කරුණකි.

මෙම ග්‍රන්ථය රචනා කළ පූජ්‍ය බණ්ඩාරවෙල සද්ධාතිස්ස හිමියන් පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් සමාජ විද්‍යාව පිළිබඳ උපාධිය ලබා (1977) සරසවි ඇදුරකු හා මානව සම්පත් කළමණාකරණ උපදේශකයකු ලෙස සේවය කරන අතරම වෘතියට අදාල පොත් රාශියක් ප්‍රකාශයට පත්කර ඇති අතර කොළඹ විශ්ව විද්‍යාලයේ මහාචාර්ය ප්‍රේම කුමාර ද සිල්වා මහතා සමඟ සම කතෘත්වයෙන් ඉදිරිපත්කරන ලද නූතනත්වය පශ්චාත් නූතනත්වය හා නව සමාජ විද්‍යා න්‍යාය නම් ග්‍රන්ථය 2018 වසරේ ජාතික සාහිත්‍යය සම්මාන උළලේදී වසරේ විශිෂ්ඨ තම කෘතිය ලෙස සම්මානයෙන් පුද ලබා ඇත. විශ්‍රම ලැබීමෙන් පසු 2017 වසරේ සිට ගරු ධම්මජීව හිමිපානන් යටතේ විපස්සනා භාවනාව ප්‍රගුණකළ අතර නායක හිමියන්ගේ කැපකරු ලෙසද දයකවී ඇත. දැනට පැවිදිවී නාහිමියන්ගේ සති පාසල හා අනෙකුත් ශාසනික කටයුතුවලට සහාය වෙමින් සිටී.

ගරු ධම්මජීව නායක හිමිපාණන්ගේ හැත්තෑවෙනි ජන්ම සංවත්සරය වෙනුවෙන් මෙම කෘතිය රචනාකර පූජාකිරීම වෙනුවෙන් එම හිමියන් හට අපගේ ස්තුතිය පිරිනමමු.

අති උතුම් සේවාව අඛන්ඩව දිගුකාලීනව ඉටුකිරීම සඳහා නාහිමියන් හට චිර ජීවනය හා සුඛී සුවපත් භාවය ලැබේවායි ප්‍රාර්ථනා කරමු.

හේමන්ත රණවක - සම ලේකම්
නිස්සරණ වන සේනාසන සංරක්ෂණ මණ්ඩලය

1. ප්‍රවේශය

'අනුග්ගහිත සූත්‍රයට අනුව කමටහන් බණක් අහන්න ලැබුනේ බුරුමයේ නේවාසිකව පණ්ඩිතාරාමයේ වැඩසිටි කාලයේ අතිපූජ්‍ය ඕවදචාර්ය ඌ. පණ්ඩිතාභිවංස ස්වාමීන් වහන්සේගෙන්ය. සිත් කාවදින ලෙසට දේශනා කළ තැන් පටන්, එය භාවනා ජීවිතයට සම්බන්ධ කරගැනීමට උත්සහ කරන අතරේ, අනෙකුත් යෝගාවචරයන් සමඟ මෙය බෙදගැනීමට ගත් උත්සහායක් මෙලෙස සිංහල බණ පොතක් ලෙස අද එළි දකී.'

දෙදහස් දහඅට වසරේ මාර්තු විසි හතර වන දින ප්‍රකාශයට පත්වූ අනුග්ගහිත සූත්‍ර දේශනා මාලාව සහිත දහම් පොතට අති පූජනීය ධම්මජීව ස්වාමීන් වහන්සේ විසින් ලියන ලද පෙරවදනේ ඇතුලත් ඉහත ප්‍රකාශයෙන් එම ස්වාමීන් වහන්සේගේ ශාසනික ජීවිතයේ පරමාර්ථය හා ස්වභාවය මැනවින් ප්‍රකට වන්නේය.

අති පූජනීය ධම්මජීව හිමිපාණන්ගේ ශාසනික ජීවිතය මෙතරම්ම වන්දනීය හා පූජනීය තත්වයකට පත්වී අද වන විට ලෝකයේ ජීවත්ව සිටින දක්ෂතම විපස්සනා කමටහන් ගුරුවරයා යන විරුදාවලිය ලැබී ඇත්තේ ඉහත සඳහන් තේමාව ඔස්සේ දිගින් දිගටම වෙහෙස නොබලා වැඩකිරීම නිසාය. අනලස්ව කඩිසරව කාය ජීවිත නිරපේක්ෂව වැඩකිරීම නිසාය.

ඈත අතීතයේදී මෙන්ම වර්තමානයේදී ද බුදු සසුනට ඇතුළුවන හා ඉන් පිටවන පිරිස් පිළිබඳව විශේෂයක් නොමැති ලෙස පෙනෙන්නේ, එය ප්‍රමාණයෙන් විශාල නිසාම පමණක් නොව, බුදු දහමේ මිහිරි එල වළඳ තමනුත් සාසනයත් බැබලවීමට සමත් ප්‍රාඥයන් ඒ පිරිස් අතර දුලභ නිසාමය. මනාව සකස් කොට වපුරන ලද කෙතෙහි අස්වැන්න ප්‍රමාණයෙන් මෙන්ම ගුණයෙන්ද උසස් තත්වයකට පත්වන්නාක් මෙන්, ඉතා වෙහෙස මහන්සියෙන් දිගුකලක් තිස්සේ කරන ලද ආර්ය පර්යේෂණයක ප්‍රතිඵලයක්වූ අති පූජනීය ධම්මජීව හිමියන්ගේ සසුන් ගතවීම හා ජීවිතය, තමන්වත්, ඇසුරට පත්වන සියළු දෙනාවත්, අඳුරෙන් ආලෝකයට කැඳවන පහන් ටැඹක් වී බබලන්නේයැයි පැවසීම අතිශයෝක්තියක් නොවේ.

2. දඟකාර ගැමි කොලුවා

පේරාදෙණිය උඩර්රියගම ගම්මානයේ විසූ ජී. කේ. ඇම් ඩිංගිරිබන්ඩා හා සී. බී.ආර්. බන්ඩාරමැණිකේ යන මා-පිය දෙපළගේ නවවැනි දරුවා ලෙස එක්දස් නවසිය පනස් දෙකේ පෙබරවාරි මස පස්වන දින උපත ලැබූ කරුණාරත්න බණ්ඩා, ළමා කාලයේ සිටම දඟ මල්ලක් වූ අතර පවුලේ අයගේ මෙන්ම ඇසුරට පත්වූ සියළු දෙනාගේම හිත් දිනාගෙන ගජ මිතුරකු බවට පත්වූයේ, එම දඟ ගතිය නිසාමය. කෙතරම් පරිණත භාවයට පත්වුවත් අදදා ස්වාමීන් වහන්සේගේ චරිතය තුල දඟකාර ගති නැතුවාම නෙවේ. දිනපතාම දහවල් දහය හමාර හා එකොළහ කාලය තුළ යෙදෙන 'භෞතික විද්‍යා විනෝදය' ලෙසින් උන්වහන්සේම හඳුන්වාගන්නා වැඩ කොටස, එදා දඟකාර කමේ වර්තමාන ස්වරූපය ලෙස ගත හැකිය. එසේම ස්වාමීන් වහන්සේගේ ශාරීරික හා මානසික සජීවි බව දිනෙන් දින පන්නරය ලබමින් ඔප වැටෙන්නේ, තෙදා ගැන්වෙන්නේ ද මෙම දඟකාර හිතුවක්කාර ගතිය නිසාමය. දහවල් දානයෙන් පසුවද බහුතරයක් දෙනා කෙටි නින්දක් සහිත විවේකයකට යහන් ගතවෙත්දී ධම්මජීව හිමිපාණන් සක්මනට හෝ කළ යුතු වැඩක යෙදෙන්නේය. දරුවන් එකොළහක් අතර නවවැනියා වීම නිසාම දෙමාපියන්ගේ හා ලොකු අප්පච්චිගේ මෙන්ම වැඩිහිටි සහෝදරයන්ගේ ද හුරතලය හා ආදරය නොඅඩුව ලැබීමට හැකිවීම දඟකාර කමේ උපත විය හැකිය. මෙම දඟයා ගැන එකල සිටි මිතුරකු පැවසුවේ (ලඟ ඉන්ඩ බයේ බෑ අඩුම ගානේ සරම හරි කඩල දානව) ලෙසය.

ගොවිතැනින් හා දැතේ කර්මාන්තයෙන් පවුල නඩත්තුවීම නිසාත්, එක්දහස් නවසිය හතලිස් ගණන්වල සාමාන්‍ය ගැමි පවුලකට අයත් අහිංසක ආකල්ප සහිත ජීවන රටාව නිසාත්, කරුණාරත්නට කුඩාකල සිටම ලද දෙයින් සතුටුව, පැමිණි දුක් පැණිරස ලෙස විඳ ගැනීමේ පුරුද්දත් අත්දැකීමෙන්ම ලැබිණි. මෙම පවුල් සමහර විටෙක වත්පොහොසත්කම් වලින් අඩු වූවත් ගුණයහපත්කම් වලින් කිසිසේත්ම අඩු නොවූ බව, ස්වාමීන් වහන්සේගේ මෙන්ම පවුලේ අනෙක් අයගේද අදත් දැකිය හැකි චරියාවෙන් හා ප්‍රතිපදාවෙන් පැහැදිලිවේ.

පේරාදෙණිය මධ්‍ය මහා විද්‍යාලයේදී සිප් සතර හදාරණ අතරම ගෙදර මව්පියන්ගේ වැඩට උපකාරවීමද, දඟකාර කමේ අංගයක් ලෙස ගෙවී ගිය අතරම, කුඩා නංගී සමඟ කඩයෙන් ගෙදරට එදිනෙදා අවශ්‍යතා රැගෙන ආ ගමන්වල දී සිදුවූ දේවල් සුන්දර මතකයන් ලෙස පවතී. පියාණන් කළුගල් සක්ක බැම්ම බඳින විට, තැනට ගැලපෙන ලෙස සක්ක

ගල සොයා දීමේ අභ්‍යාසයේදී, පියාගෙන් ලද උපදෙස්, වෙහෙස මහන්සියෙන් ගොඩනඟන හරවත්, තෙදවත්, ජීවිතයකට පදනම සැකසීය. කුඹුරට බැස වැඩිහිටියන් හා හරි හරියට හීයට සහභාගිවීමෙන් හා නිසි පරිදි නියරයට මඩ තැබීමෙන්ද, පෝරු ගෑමෙන්ද, ලද ප්‍රායෝගික පුරුද්ද හා දැනුම පසුකාලීන ජීවිතයට මහා සම්පතක්විය. කෘෂි විද්‍යාපීඨයට තේරුණු පසුව, මහාචාර්යවරුන්ට ඉදිරියෙන් සිටිමින්, ප්‍රායෝගික කෘෂිකර්මාන්තය ගැන කථාකිරීමට හැකිවූයේ, පියාගෙ ඇසුරෙන් ලද කළපුරුද්ද හා මෙම දඟකාර කම නිසාමය. පසුකාලීනව චිත්ත සන්තානය තුළ ඡන්ද, චිත්ත, විරිය, විමංසා යන සතර සෘද්ධිපාද ලෙසින් මෝරා වැඩුනේ මෙම දඟකාර කමේ බීජය විය හැකිය.

හිතේ හයිය කෙසේ වෙතත්, පාසැල් ගොස් එන අතර තුරදී සිදුවූ ඇබැද්දීන් අදටත් පාඩම් ලෙස හිතේ පවතී. එම අවස්ථාවන් ස්වාමීන් වහන්සේ විසින්ම හෙළි කරනු ලබන්නේ තම චරිතයේ අව්‍යාජ හා නිහතමානී ගුණයද ප්‍රකටවන හා ඉස්මතු වන අන්දමින්ය. ලොකු අප්පච්චි ඉතාම ආදරයෙන් ඔලුව අත ගා ගණන් පාඩමේ එකතුකිරීම හා වැඩිකිරීම පමණක් කියා දුන්නද, කරුණාරත්න ඉගෙනගත්තේ අඩුකිරීම හා බෙදීම පමණක් බව, අද ජීවිතය හැඩ ගැස්වී ඇති ආකාරය බලන විට පෙනේ. පාසැල් කාලයේදී ඉගෙනීමට අයියලා අක්කලා තරම්ම උනන්දුවක් පෙන්වූයේ නැතත්, තරුණ වියට එළඹෙන විට සියල්ල වියයුතු ආකාරයෙන් සිදුවිය.

පාසැල් අධ්‍යාපනය නිමාවන විට දඟකාරකමත්, දක්ෂතාවයත්, බුද්ධියත්, එක්ව ක්‍රියාත්මකවූ බව, කැඩෙට් කණ්ඩායමේ ලාන්ස් කෝප්‍රල් පදවිය ලැබීමෙනුත්, පේරාදෙණිය සරසවියේ කෘෂිවිද්‍යා පීඨයට ඇතුලු වීමට සුදුසු ලෙස උසස් පෙළ විභාගය සමත්වීමෙනුත් සනාථවේ. උසස් පෙළ සමත්වීම හා සරසවි පිවිසුමට සුදුසුකම් ලැබීම පිළිබඳව අති පූජනීය ධම්මජීව හිමිපාණන් වර්තමානයේ කරන හෙළිදරව්ව, එනම් තමන් සරසවි පිවිසුම ලැබූයේ දෙවන වර විභාගයෙන් සමත්වීම නිසා බව පැවසීම, එම චරිතයේ අව්‍යාජ බව හා නිහතමාණී ගුණය ප්‍රකට කරවන්නකි

3. සරසවි වරමින් විශ්වයට ප්‍රවේශය

එක්දහස් නවසිය හැත්තෑව දශකයේ සරසවියට ඇතුළුවීම යනු සැබවින්ම විශ්වයට ප්‍රවේශය ලැබීමක් හා සමාන විය. ඒ හේතු දෙකක් නිසාය. පළමුවැන්න නම් එකළ කෘෂිවිද්‍යා පීඨයක් තිබුනේ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පමණක් වීම නිසා, එම අවස්ථාව උදාපත්වූයේ දක්ෂයන් අතර දක්ෂයන් වූ සුළුපිරිසකට පමණක් වීම නිසාය. දෙවන කරුණනම්

ලංකාවේ එක්දහස් නවසිය විසි ගණන්වල සිට පනස් ගණන් දක්වා සිදුවූ ආණ්ඩුක්‍රම හා දේශපාලන ප්‍රතිසංස්කරණ නිසා සිදුවූ මහා සමාජ පෙරළියේ, සජීවී ප්‍රතිඵල කරලියට පැමිණියේ, නවසිය හැට, හැත්තෑව දසකයේ පටන් වීම නිසාය. එක් උදහරණයක් දක්වතහොත්, යටත්විජිතවාදයේ දයාදයක් ලෙස ලැබුණු උසස් අධ්‍යාපනයේ හා රැකියා ක්ෂේත්‍රවල ඉංග්‍රීසි භාෂාවට තිබූ විශේෂ වරප්‍රසාද ඉවත්වී, ස්වජාතික භාෂාවන් වන සිංහලයට හා දෙමළට තැන ලැබිනි. අති පූජනීය ධම්මජීව ස්වාමීන් වහන්සේ වැනි තවත් දහස් ගණනක් ගැමි දරුවනට (මෙම සටහන ලියන මම ද ඇතුලුව) උසස් අධ්‍යාපනයට හා උසස් යයි සම්මත රැකියාවලට දෙර විවෘත වුනේ මෙම පෙරළිය නිසාය.

සම්බුද්ධ සාසනය හා ධර්මය සම්බන්ධයෙන් ගතහොත් දෙදහස් පන්සීයේ බුද්ධ ජයන්තිය මුලික කරගෙන ත්‍රිපිටකය සිංහලට පරිවර්තනය කිරීම හා සමගාමීව සිදුවූ ක්‍රියාකාරකම් නිසා, බුද්ධාගම පිළිබඳ ආකල්පවල පුනර්ජීවනයක් සිදුවිය. ඒ සමගම පුවත්පත් කලාව, නවකථා, නාට්‍යය, චිත්‍රපටි ආදී කලා ක්ෂේත්‍ර වල විශාල ඉදිරි පිම්මක් ඇතිවී, ස්වදේශානුරාගය පුබුදුවන සමාජ සංචලනයේ ප්‍රවේගයක් බවට පත්විය. අධ්‍යාපන අංශයේ විශාල පෙරළියකට හා පිම්මකට මංපෙත් විවරකරමින් නිදහස් අධ්‍යාපන ක්‍රමය හඳුන්වාදීම හා එහි එක් අංගයක් ලෙස රට පුරාම මධ්‍ය මහා විද්‍යාල ජාලයක් ආරම්භ කිරීම නිසාත්, ශිෂ්‍යත්ව විභාගයෙන් සමත්වන දිළිඳු පවුල්වල දරුවන් හට එම මධ්‍ය මහා විද්‍යාලවල ඉගෙනීම සඳහා පහසුකම් සැපයීම නිසාත්, සාමාන්‍ය පවුල්වල දරුවන් හට සමාජ සංචලනයේ ඉදිරි ගමනට ජවය සැපයීමට මෙන්ම, ඉන් ඵල නෙලාගැනීමටද අවස්ථාව උදාවිය.

අධ්‍යාපනය, සාහිත්‍යය, කලාව යන අංශවල ඇතිවූ ප්‍රබෝධයත් සමඟ පොතපත කියවීම ඉගෙනීමේම කොටසක් බවට පත්විය. අද කාලේ මෙන් සන්නිවේදන උපාංග හා ක්‍රමවේද බහුල නොවූ යුගයේ සාමාන්‍ය ජනතාවගේ විනෝදාංශය වූයේ, පොතක් පතක් කියවීම හා ගුවන් විදුලියේ ප්‍රචාරයවූ මුවන් පැලැස්ස වැනි නාට්‍යයක් රස විඳීමය. අති පූජනීය ධම්මජීව හිමිපාණන් මෙම අවස්ථාව මැනවින් භාවිතාකර ඇති බව ධර්ම දේශනා අතර තුරදී උපුටා දක්වන කවි, ගීත හා කතන්දරවලින් සනාථවේ.

මෙම වාතාවරණය තුළ විශ්ව විද්‍යාලයට ඇතුලුවූ කරුණාරත්න, එම මහාර්ඝ අවස්ථාවෙන් සතුටුදයක ඵල නෙලාගත් බව, ඉදිරි ජීවිත විවරණයේදී දැකිය හැකිය. දිනපතා සරසවියට පැමිණියේ පුරුදු ගෙදර සිට නිසා, මිතුරු ඇසුර දහවල් කාලයට පමණක් සීමා වුවත්, බැච් එකේ

ජනප්‍රියම පුද්ගලයන් ගෙන් එක් අයෙකු වූයේ දඟකාර විහිලුත්, ඕනෑම අවස්ථාවක සහයෝගය අවශ්‍ය මිතුරන් හට නොමසුරුව උදව් උපකාර කළ නිසාත්ය. කරුගේ කාර්යශූරත්වය වඩාත් කැපී පෙනුනේ, මහඉලුප්පල්ලමේදී හා උඩුවෙල වත්තේ දී යෙදුණු ප්‍රායෝගික ක්‍රියාකාරකම් වලදීය. විශේෂයෙන් උඩුවෙල වත්තේ ක්ෂේත්‍ර වැඩවලදී ඔලුව වටා ජටාවක් බැඳගෙන, ඊට උඩින් තොප්පියක්ද දමා ගත් මේ හැඩි දැඩි දේහධාරී තරුණයා ගේ සජීවී සක්‍රීය බව නිසාම, අන්වර්ථ නාමය ලෙස අරාබි රටේ රජ කෙනෙකුගේ නමක් ද ලැබිනි. අදත් බැච් එකේ වැඩිදෙනෙක් මෙම චරිතය හඳුන්වන්නේ එම නමින්වීම විශේෂයකි.

ඉගෙනීමේ වැඩට සූරයකු බව පිටට නොපෙන්නුවාට ඇතුලතින් දිගු කාලීන බලාපොරොත්තු ඇතිව ඉගෙන ගත්තේය. පරීක්ෂණාගාරය තුලත්, ක්ෂේත්‍රයේදීත්, යම් යම් සංකල්ප විදුහුරු ඇසින් බලමින් ප්‍රායෝගිකව අධ්‍යයනය කිරීම තුල, ස්වභාව ධර්මයේ පැවත්ම පිළිබඳව විශ්ලේෂනාත්මක චින්තනයක් නිර්මාණය විය. ඊට අමතරව සිංහල මාධ්‍යයෙන් පරීක්ෂණවලට පෙනී සිටියත්, ඉංග්‍රීසි මාධ්‍යයෙන් පන්තිවලට සහභාගිවී, ඉංග්‍රීසි බස භාවිතය දියුණුවීම නිසා බාහිර දැනුමට දොර විවෘත වුනේය. පසුකාලීනව මනෝ විද්‍යාව හා සමාජ විද්‍යාව මෙන්ම, ථේරවාදී හා මහායාන බුද්ධාගම පිළිබඳවත්. එසේම ථේරවාදී බුද්ධ ධර්මයේ දර්ශනික හා ප්‍රායෝගික බව ඉස්මතු වන බටහිර ලේඛකයන් අතින් ලියවුනු ලේඛනද අසීමාන්තිකව කියවා පුළුල් පදනමක සිට දැණුම පරිහරණය කිරීමට හැකිවූයේ එම හුරුව නිසාමය. වර්තමානයේ මෙතරම් හොඳින් ධර්ම ඥාණය වගා වර්ධනය කරගත්තේත්, එම ධර්ම අවබෝධය පැහැදිලිව හා නිරවුල්ව දෙස් විදෙස් යෝගාවචරයන් හට සිංහල හා ඉංග්‍රීසි භෂා දෙකෙන්ම ලබා දීමේ කුසලතාවය වර්ධනයවී ඇත්තේත්, එම කැපවීම නිසාය.

සරසවි අධ්‍යාපනය ලබන කාලය තුළ වුවත්, පාසැල් කාලයේදී දහම් පසැල් ගිය පේරාදෙණිය ශ්‍රී සුබෝධාරාරාමයේ විහාරාධිපතිව එකල වැඩසිටි දෙමළ භාෂාවටද ප්‍රවීනයකු හා දක්ෂවූ ධර්ම දේශකයන් වහන්සේගේ දේශනාවලින් ලද පන්නරය හා උත්ප්‍රේරණය නොමැකෙන අන්දමින් හිත් වැදී තිබුනි. චුල්ල වේදල්ල සූත්‍රය ඉතාම දක්ෂ ලෙස විවරණය කළේ එම හිමියන් බව අදටත් මතකය. එම ආභාෂය නිසාම නිතර නිතර ශ්‍රී සුබෝධාරාමයට යමින්, එහි පුස්තකාලය භාවිතා කරමින් හා පූජණීය වත්තේගම ධම්මාවාස හිමියන් සමඟ ඇසුර පවත්වමින්, බුද්ධ ධර්මය පිළිබඳ හැඟීම දැනීම වර්ධනය කරගැනීම, ක්‍රමක්‍රමයෙන් ජීවිතය පිළිබඳ යතාර්ථය කෙරෙහි අවධානය යොමුවීමට බලපෑවේය.

4. ජීවිතයේ හැරවුම් ලක්ෂයක් - කිං කුසල ගවේෂී

විද්‍යා අධ්‍යාපනය තුලින් ලද පන්නරය බුද්ධ ධර්මයේ එන න්‍යායන් - උදාහරණයක් ලෙස, පටිච්ච සමුප්පාද න්‍යාය විද්‍යාවේ එන reductionism (ලඝුකරණය) වැනි න්‍යායන් සමඟ සාපේක්ෂ කොට බැලීමට පෙළඹවීය. මෙම කාලය තුළදීම ඕස්ට්‍රේලියානු ජාතික සුදු හාමුදුරුනමක් වූ එස්. ධම්මික හිමියන්ගේ හමුවීම තීරණාත්මක සිද්ධියක් විය. බුද්ධ ධර්මයේ යථාර්තවාදී ප්‍රායෝගික වටිනාකම මඟ හැර, ලාමක අපේක්ෂාවන් හා පිංකම් පසුපස හඹා යාමේ ගතානුගතික භාවයේ ආදිනවය හා සැබෑ ධර්මය නම් එළඹෙන මොහොත පිළිබඳව අවධියෙන් සිටීම බව දැනගැනීම, සමස්තයම වෙනස් කිරීමට සමත්විය. පූජනීය ඥාණපෝණික හිමියන් විසින් රචිත Power of mindfulness පොත කියවීමට ලැබීම සිදුවෙමින් පැවති මානසික වෙනසට අළුත් මානයක් එකතුකළේය. එතැන් සිට පේරාදෙණිය සරසවියේ බුද්ධ ධර්මයට ලැදි කණ්ඩායමක් මූලිකවී පිහිටුවාගත් වේළුවන ධර්ම කණ්ඩායමට එක්වී, ධර්ම සාකච්ඡාවලට හා භාවනාවට යොමුවී නවමු ලෝකයක සැරිසැරීම ආරම්භවිය. එහෙත් ධම්මික හිමියන්ගේම උපදෙස් මත නව ගමන් මඟ පිළිබඳව කිසිවකු හට හෙළි නොකිරීමට අදිටන් කරගත්තේ අනවශ්‍ය ප්‍රශ්න මඟ හැරීම සඳහාය. එහෙත් හිත වසංගාගෙනම සිටීම අසීරු නිසාදෝ, ගෙදර ගොස් අම්මා හා අක්කලා සමඟ ධර්ම රහස් පැවසීම ඒ අයට හුරතලයක් වූ බව ස්වාමීන් වහන්සේ අතීත මතකයන් පවසන අවස්ථාවලදී පැහැදිලිව පෙනේ. මහාචාර්ය ලීලී ද සිල්වා මහත්මිය විසින් භික්ෂූන් වහන්සේලා උදෙසා ගැටඹේ පන්සලේදී පවත්වන ලද පාලි භාෂා පන්තියට සහභාගිවීම කරුණාරත්නගේ හිත ධර්මය ඇතුලතට නැවීමත්, ගිහි ජීවිතයෙන් මිදී, සම්පූර්ණ කාලය ධර්මය වෙනුවෙන් කැපකිරීමේ කැමත්තත් පැහැදිලි කරන සිද්ධියකි. මෙම පන්තියේදී හමුවූ බර්න් විශ්ව විද්‍යාලයේ මිර්කෝ ෆ්‍රීබා මහතා සමඟ සම්බන්ධවීම දිගුකාලීන හා ගැඹුරු ශාසනික මිතුදමක් විය.

මේ අතර තුර එක්දහස් නවසිය හැත්තෑ හතේදී සරසවියේ අධ්‍යාපනය ලබන කාලයේදීම පියාණන් රෝගාතුරවීමත්, සියලු ප්‍රතිකාර හා උත්සාහයන් අවසන පියතුමා මෙලොව අතහැර යාමත් නිසා, ජීවිත බලාපොරොත්තු පිළිබඳව නැවත සිතා බලන තත්වයකට කරුණාරත්න පත්විය.

කෙසේ වුවත් පශ්චාත් උපාධියත් නිමවා, වසර හයක කාලයක් ජාත්‍යන්තර සමාගමක ප්‍රධාන විධායක නිළධාරී ලෙස රැකියාවක නිරතවන අතර තුරත්, ධර්මය හැදෑරීම හා ප්‍රායෝගිකව පිළිපැදීම අත් හැරියේ නැත. එම කාලය සිහිගන්වමින් ධම්මජීව හිමියන් පවසන්නේ නිල්ලඹ පරිසරයේ නිහඬ බවත්, සාකච්ඡාවලදී මතුවූ ධර්ම ඥාණයත් විසින් තමාව ප්‍රීතියෙන් ප්‍රමෝදයට පත්කළ බවත්ය.

නිල්ලඹදී ගොඩ්වින් සමරරත්න මහතා හා එහි පැමිණි ධර්ම පිපාසාවෙන් පෙළුණු රිචඩ් ඩේවිඩසන් හා ජෝසප් ගෝල්ඩ්ස්ටයිම් වැනි බටහිර ජාතිකයන් හා සංවාදයට ලැබුණු අවස්ථාව ධර්ම ඥාණයේ නිම් වළලු පුළුල්කිරීමට සමත්විය. ස්වාමීන් වහන්සේගේ වර්තමානයේ ඉතාම ප්‍රබලව, ඉස්මතුව පෙනෙන අනෙකුත් ආගමික දර්ශනයන්ගේ හරයාත්මක අගයන් ඉවසීමේ හා ඇගයීමේ ප්‍රවනතාවය එම දර්ශනය පුළුල්වීමේ පැහැදිළි සාක්ෂියකි. එම සතුටුදයක කාලය තුලම සිදුවූ එක්තරා සිද්ධියක් තරුණ යෝගාවචරයා තුළ කුකුසක් මතුකළේය. නිල්ලඹ භාවනා සැසියක් අවසන්කර ආපසු පේරාදෙණිය බලා එන ගමනෙහිදී පැමිණි කණ්ඩායම සමඟ සාකච්ඡාවේදී තම භාවනා අත්දැකීම ගැන සඳහන් කරන අවස්ථාවේදී එහි සිටි එක්තරා වැඩිහිටි සරසවි ඇදුරෙක් පැවසුවේ, 'අනේ පුතේ, දැනගත්තට කමක් නැහැ. කරන්න නම් යන්න එපා. පිස්සු හැදෙනවා' කියාය. මෙය තරුණ යෝගාවචරයාගේ හිතට පොල්ලකින් දමා ගැසුවා වැනිවිය. ඒ සමඟම ධම්මික හිමියන්ගේ උපදෙස් මතක්වී නිහඬවිය. පසුකාලයක මෙම සිද්ධිය මතක්කරමින් ඥාණාරාම ස්වාමීන්වහන්සේ සමඟ ඇතිවූ සාකච්ඡාවකදී, එම ප්‍රකාශය නිසා තමාගේ වසර දහයක කාලයක් අපතේ ගිය බව පවසන විට, ඥාණාරාම හිමියන් පවසා ඇත්තේ, 'තනි ජීවිතයක පැත්තෙන් බලන විට වසර දහයක් දිගුකාලයක් වුවත්, සංසාරයට සාපේක්ෂව බලන විට වසර දහය කුමක්ද?' යන්නය.

ධර්ම පුහුණුවේ සාර්ථකත්වය සනිටුහන් කරමින් ගොඩ්වින් මහතා විදේශගතවන විට එම ස්ථානය කරුණාරත්න යෝගාවචරතුමා හට භාරකර ගියේය. මෙම කාලය තුළදීම පූජනීය බලංගොඩ ආනන්ද මෛත්‍රීය හා අම්පිටියේ රාහුල හිමියන් වැනි සංඝ පීතෘවරුන් හමුවී, උපදෙස් අනුසාසනා ලබාගැනීමට තරම් මේ ජීවිතය පෙර කරන ලද පිණින් පිරී තිබිණි. මහනුවර බෞද්ධ පොත් ප්‍රකාශන සමිතිය (BPS) හා සම්බන්ධවෙමින් අති පූජනීය හිමිවරුන්වන ඥාණපෝණික හිමියන් හා භික්ඛු බෝධි හිමියන් වැනි ප්‍රමාණික උගතුන් හා ඇසුරට පත්වීම පටු මතවාදවලට නොවැටී ධර්මය, ධර්මය ලෙසින් අවබෝධ කරගැනීමට හා

නිර්භයව ප්‍රකාශකිරීමට හා දේශනා කිරීමට ශක්තිය හා පුරුද්ද ලබා දී ඇත. වර්තමානයේ බහුතරයක් දෙනා සර්ව ආගමික වාදය වේදිකාවේදී මෝස්තරයක් බවට පත්කරගත්තත්, ධම්මජීව හිමියන් සැබෑම බුද්ධ පුත්‍රයකු ලෙස අවිරුද්ධ ප්‍රතිපදාවේ හිඳිමින්, අන්මත ඉවසමින් කටයුතුකිරීම නිසාම, ජාතික ආගමික සීමාවලින් තොරව සියලුම මනුස්ස ප්‍රජාව තුළ සතිමත් බවේ පණිවිඩය ශක්තිමත්ව හා ප්‍රායෝගිකව පිහිටුවීමට හා ස්ථාපිත කිරීමට සමත්වී ඇත.

තමාගේ ධර්ම කුසලතාවයන් ඔප් නංවාගැනීමට මෙන්ම, හිතමිතුරන්ගේ ධර්ම ඥානය වැඩිදියුණු කිරීමත් අරමුණුකරගෙන, නායක හිමියන්ගේ අනුග්‍රහයෙන් ශ්‍රී සුබෝධාරාමයේදී භාවනා පන්තියක් එකදස් නවසිය අසූ තුනේදී ආරම්භකර පවත්වා ගෙන ගියේ දැඩි කැපවීමකිනි. එම පුරුද්ද අනාගතය වෙනුවෙන් සූදානම්වීමක් ලෙසද අර්ථ ගැන්විය හැකිය. ඒ ඡන්ද, චිත්ත, විරිය, විමංසා සෘද්ධිපාද ක්‍රියාත්මක වූ අවස්ථාවකි

5. විමර්ශන හා පර්යේෂණ

බාහිර ජීවිතය තුල මෙම ක්‍රියාකාරකම් සිද්ධවෙමින් පවතින අතරම කරුණාරත්න යෝගාවචරතුමාගේ සිත අභ්‍යන්තරයේද විප්ලවයක් සිද්ධවෙමින් පැවතිනි. එම විප්ලවය පිළිබඳව ඔස්පෙන්ස්කි නම් ලේඛකයාගේ න්‍යායාත්මක අදහසක් උපයෝගී කරගනිමින් පසුකාලීනව පූජනීය ධම්මජීව හිමියන් විස්තර කරන්නේ මෙසේය. අභ්‍යන්තර වෙනසක් සඳහා සූදානම්වන සිතක පහත සඳහන් කරුණු හතර දැකිය හැකිය.

- තමා පිළිබඳවම දැඩි ස්වයංවිවේචනාත්මක සිතුවිලි උපදී. (Self-criticism) *ප්‍රසිද්ධියේම සිල්පද කඩමින්, හැදුනු ගෙදර නැහැදුනු තරුණයා ලෙස හැසුරුණු තමන් හට හරියට සිල්පද රකිමින් හික්මීමක් සහිත පැවිදි ජීවිතයක් ගතකළ හැකිද?*
- සමාජ අසාධාරණයන්ට විරුද්ධව ප්‍රභල හටනක් සිතතුල ඇතිවේ. (Radicalism) *පැවිද්ද හා සිල් පද ඉල්ලලා ගන්නා භක්ෂූන් වහන්සේලා එම ශීලය නොරකින්නේ ඇයි?*
- සියල්ලම සමව සාධාරණව සිදුවිය යුතුයයි සිතේ.(Social justice) *බුදුන් වහන්සේ නියම ධර්ම මාර්ගය පැහැදිළිව පෙන්වා තිබියදී සියළු දෙනාම ලාමක කුසල් පසු පස හඹා යන්නේ ඇයි*

- සිදුවන සියළුම දේවල් පරිපූර්ණවම සිදුවිය යුතුය. (Perfectionism) *සියළු දෙනාම තම තමාට අයත් සියළු කටයුතු පිරිසිදුව නිවැරදිව සම්පූර්ණව කළ යුතුය.*

එකල පැවති පැවිදි සමාජයට සාපේක්ෂව මෙම කරුණු හිත තුල විග්‍රහ වූ අතර මෙම කරුණු සියල්ල මෙසේ අංග සම්පූර්ණව සිදුවන සමාජයක් වර්තමානයේ නොමැති බවත්, බුදුන් ජීවමාන සමයේද භික්ෂූන් අතර අලජ්ජීන් සිටි බවද තේරුම් ගැනීමට සෑහෙන ජීවිත අත්දැකීම් සහිත යෝගාවචරතුමාට වැඩි දවසක් ගියේ නැත.

පැවිදිවීම සඳහා හිත හදගත්තත්, කිසිවකු හට ඒ බව හෙළි කෙරුවේ නැත. එහෙත් තමා ඒ සඳහා කෙතරම් සූදානම්දැයි දැනගැනීම සඳහා කරන ලද පරීක්ෂණය රසවත් සිද්ධියකි.

භාවනා පන්තියට පැමිණි ඉතාම හිතවත් මිතුරන් තිදෙනකුට අවම අඩුම-කුඩුම සමග දින තුනක ගමනකට සූදානම්වී පැමිණෙන ලෙස දැන්වීය. නියමිත දිනයේදී කණ්ඩායම උදයෙන්ම මහනුවරින් බසයට ගොඩවී දහවල් වන විට අනුරාධපුරයට සේන්දුවිය. හවස් වන තුරුම අනුරාධපුර ශුද්ධ භූමි ප්‍රදේශය පුරාම එම ස්ථානවල පුරාවිද්‍යා වටිනකම් හඳුන්වා දෙමින් සංචාරය කළහ. හවස නිදගැනීමට සූදානම්කර තිබුණු ස්ථනය අමුම අමු නරාවලක් විය. කරුණාරත්නට කෙසේ වෙතත් පිරිසට මදුරුවන් හා මැක්කන් පිරි අපිරිසිදු එම පරිසරයේ රැය පහන්කිරීම නම් මහම දුකක් විය. එහෙත් මිත්‍රත්වයේ නාමයෙන් ඉවසා සිටීමට පිරිස තීරණය කළහ. කෙසේ වෙතත් දෙවෙනි දවසටද අනුරාධපුර සංචාරය නිමකොට මිහින්තලයට යාමට පිටත්වූවත්, මඟ ගෙවා තිබුනේ පුත්තලම දෙසටය. ඒ අධිකතර වෙහෙස නිසාමය. කෙනෙකුගේ උපදෙස් මත නැවත හැරී පා ගමනින්ම මිහින්තලයේ පන්සලට අඳුරේම ඇතුලුවන විට එහි සිටි නාහිමියන් තරුණියන් දෙදනෙකුද සිටි මෙම කණ්ඩායමට නැවතීමට අවසර දුන්නේ කැමත්තකින් නොවේ. කෙසේ වෙතත් වැවෙන් දිය නාගෙන කණ්ඩායමම එකතුවී පිරිත් කියන විට එම හිමියන් ද පැමිණ බිස්කට් හා තේවලින් සංග්‍රහ කිරීම බඩට මෙන්ම හිතටද නව පණක් ලබා දුන්නේය. මෙම දුෂ්කර ගමනේ අරමුණ පැහැදිලිවූයේ ආපසු නුවරට පැමිණීමෙන් පසුවය. ‘මට අවශ්‍ය උනා අවම පහසුකම්වලින් යැපෙන්න පුළුවන්ද කියල ටෙස්ට් කරලම බලන්න.’ පැමිණි පිරිසට පින් අනුමෝදන්කර ගමන අවසන්විය.

දැන් අභිනික්මණ සඳහා සියල්ල සූදානම්ය. එහෙත් අම්මාගෙන් අවසරය ලැබෙන පාටක් නැත. අවසානයේදී ගොඩ්වින් සමරරත්න

මහතාද ඇතුළු නියෝජිත පිරිසක් ගෙදරට ගොස් අම්මා හමුවිමට තීරණය කළහ. එහිදී වැඩිමහල් සහෝදරයන් හය දෙනෙකුගේ මඟුල් පොටෝ පෙන්වූ අම්මා පොඩිපුතාගේ පොටෝ එක තැබීමට සූදානම් තැනද පෙන්වූවාය. බලාපොරොත්තු නොවූ තත්වය නිසා අන්ද මන්ද වී සිටින විට, ආගන්තුක සත්කාර ලෙසින් ලැබුණු තේ කොප්පයක් බී, අවසරය ගැන නොවිමසාම පෙරලා පැමිණීමට නියෝජිත පිරිසට සිදුවිය.

කෙසේ වුවත් මීතිරිගලට ගිය කරුණාරත්න අති පූජනීය ඥානාරාම හිමියන් සමඟද සංවාදයට ගියේ විවේචනශීලීව හා විමසුම් හැඟීමෙන්මය. සමථ විදර්ශනා භාවනා, සප්ත විශුද්ධි හා විදර්ශනා ඥාණ, සත්තානුපස්සනා ආදී භාවනා උපදෙස් ග්‍රන්ථවල ලියවී තිබුණු ගැඹුරු භාවනා අත්දැකීම් අති පූජනීය ඥාණාරාම හිමියන්ගේ චර්යාව පුරාවටම විද්‍යාමානවනු දකින විට, තමන් ගත් තීරණය ඉතාම නිවැරදි බව කරුණාරත්න හට අවබෝධ විය. ඉතාම අඩුවෙන් කථාකරමින් පූජනීය කටුකුරුන්දේ ඥාණානන්ද හා නාඋයනේ අරියධම්ම හිමියන් වැනි යෝගාවචර පිරිසක් දැඩි හික්මීමකින් යුතුව භාවනා මාර්ගයේ මෙහෙයවනු දැකීම කරුණාරත්න හට උත්ප්‍රේරණයක් විය.

6. භව ගමන කෙළවර කරන්නට අනුපුබ්බ කිරියා, අනුපුබ්බ සික්ඛා, අනුපුබ්බ පටිපදා

පැවිදිවන දිනය උදාවිය. පැවිදිවීමට පෙර අවසන් වරට ඥාතීන් හට වඳින විට කිරි අක්කා බිම පෙරලී ඇඬුවත් කරුණාරත්නගේ නෙතට කඳුළක් ආවේ නැත. එහෙත් පැවිදිවීමෙන් පසුව පැමිණි විට අන් ඥාතීන් තමන් වහන්සේට වඳින විට කඳුලක් කම්මුල දිගේ පහලට රූරා වැටෙන විට නවක හිමියන් පැවසුවේ, ‘මම මෙතනට එන්න කොයි තරම් කාලයක් ගත්තාද, දුකක් වින්දාද’ කියාය. මේ අන්දමින් ඉතාම සෙල්ලක්කාර හා සැහැල්ලු එහෙත් ගැඹුරු අන්දමින් කිං සච්ච ගවේෂී හා සද්ධාණුසාරී ජීවිතයක් ගතකරමින් සිටි කරුණාරත්න තරුණයා පූජ්‍ය උඩර්රියගම ධම්මජීව බවට පත්වූයේ එක්දහස් නවසිය අසූඅටේ නොවැම්බර් දහසයවන දිනදීය. මුලින් සඳහන් කරන ලද පරිදි අති පූජනීය ඥාණාරාම නාහිමියන්ගේ උපාධ්‍යත්වය හා පූජනීය ඥාණානන්ද හිමියන්ගේ ඉගැන්වීම් හා උපදෙස් මත මහන දම් පුරා, සාමණේර අවධිය පසු කොට, එක්දහස් නවසිය අනූවේ ජූනි මාසයේදී ගල්දූව සීමාමාලකයේදී අධිශීල සහිත උපසම්පදාවට පත්විය.

එතැන් සිට අති පූජනීය ඥාණාරාම හිමියන් විසින්ම ලියන ලද යෝගාශ්‍රම සංස්ථා ව්‍යවස්ථාවට හා කතිකාවතට අනුව අරණ්‍යගත භික්ෂූන් වහන්සේ නමක් ලෙස භාවනාව වඩමින්, තමා විසින් සොයාගෙන එන ලද විමුක්ති මාර්ගයෙහි ගමන් කරන අතරම, පූජනීය ඤාණනන්ද හිමියන් ප්‍රමුඛ වැඩිහිටි හිමිවරුන්ගෙන් ලැබුණු දැනුම හා ආදර්ශය, තම ගමනට අත්වැලක් කරගත්තේය. මෙම අවධිය වන විට මීතිරිගල වන සෙනසුනද භාවනා යෝගීන්ගේ පර්යේෂණ මධ්‍යස්ථානයක් බවට පත්වී තිබිනැයි පැවසීම අතිශයෝක්තියක් නොවේ. අති පූජනීය ඥාණාරාම හිමියන් හට අවශ්‍ය වූයේ හැකිතාක් දුරට මෙම ජීවිතයේදීම පිළිවෙත පුරා ප්‍රතිඵල ලැබීමය. සමහර පිරිස් සමථයට හා අභිධර්ම මාර්ගයට වැඩි ප්‍රියමනාප බවක් දැක්වීම නිසා, මූලික අරමුණින් පිට පනින බවක් දක්කට ලැබිණි. මෙම තත්වයට පිළියමක් ලෙස බුදුන්වහන්සේගේ ධර්මයට අනුව සූත්‍ර පිටකය ආශ්‍රයෙන් නිවන් මඟ පැහැදිළි කිරීමට පූජනීය ඤාණනන්ද හිමියන්හට ආරාධනා කරන ලදී. එවැනි උතුම් ආරාධනාවක් වූවත් එක්වරම භාර ගැනීමට පූජනීය ඤාණනන්ද හිමියන් අදිමදි කළේ හා පසුබට වූයේ මත විවිධත්වයේ තිබූ බරපතළකම නිසාම විය හැකිය. අති පූජනීය ධම්මජීව හිමියන්ගේ දඟකාර හිතුවක්කාරකම් යහපත් ආකාරයෙන් ක්‍රියාත්මකවීමට අවස්ථාව එළඹුනේය. මතවාදීමය වශයෙන් ගතාණුගතිකත්වයෙන් මිදීමට මාන බලමින් සිටි අති පූජනීය ධම්මජීව හිමියන්, පූජනීය ඤාණනන්ද හිමියන් හට සවියක්විය. පසුකාලීනව පැවසුණු ආකාරයට පූජනීය ඤාණනන්ද හිමියන්ගේ දේශනාවලදී මතවාදී සටන දියත්කරන විට ප්‍රායෝගික ක්ෂේත්‍රයේ බලඇණිය වී ඇත්තේ අති පූජනීය ධම්මජීව හිමියන්මය. එම මැදිහත්වීම අති පූජනීය ධම්මජීව හිමියන්ගේ ධර්මඥාණය වැඩීමට මෙන්ම භාවනායෝගියකු ලෙස පරිණතවීමටද මහත් පිටුබලයක් වූ බව පවසන්නේ කෘතගුණ පූර්වකවය.

අති පූජනීය ඥාණාරාම මහ තෙරුන්ගේ ජීවිතයේ අවසාන කාලයේදී අග්‍රඋපස්ථායක වෙමින් ගුරු පූජා පැවත්වීමට අති පූජනීය ධම්මජීව හිමියන් හට අවස්ථාව ලැබිණි. නායක හිමියන් ලඟින්ම ඇසුරුකිරීමට අවස්ථාව ලැබීම නිසා තමන්ට ලැබුණු ලොකුම වාසිය ලෙස අති පූජනීය ධම්මජීව හිමියන් සලකන්නේ, සියලු ගුණ වඩාගෙන එම ගුණයන් හෙළිනොකර වසංගාගෙන උතුම් උසස් ජීවිතයක් ගතකරන ආකාරය ඉගෙනුමට අවස්ථාව ලැබීමය. කෙසේ වුවත් සියලු සංස්කාර ධර්මයන් අනිත්‍ය බව පසක් කරමින් එක්දහස් නවසිය අනූතුනේදී අති පූජනීය ඥාණාරාම හිමියන් අපවත්වූ පසු අති පූජනීය ධම්මජීව හිමියන්

තම යෝගාවචර ජීවිතය ප්‍රායෝගිකව සවිමත් කරගැනීමේ මංසෙවීමේ අරමුණින් බුරුමයට වැඩම කළහ.

අති පූජනීය ධම්මජීව ස්වාමීන් වහන්සේගේ පැවිදි ජීවිතයේ එකම පරමාර්ථය සතිපට්ඨානය වැඩීම හා තව තවත් යෝගාවචරයන් ඒ සඳහා පොළඹවමින්, ඔවුන්ගේ භාවනාමය ඥාණය වර්ධනය කරගැනීමට උපකාරවීමය. ඒ අතින් බලන විට ස්වාමීන් වහන්සේ බුරුමයට වැඩමවීම සිංහල බෞද්ධයින්ගේ වාසනාවක් යැයි කීම යුක්ති සහගතය. මෙම ස්වාමීන් වහන්සේ බුරුමයට වඩින සමයේ බුරුම රට විපස්සනා භාවනාවේ කේන්ද්‍රස්ථානය බවට පත්වී තිබුනේය. අති පූජනීය මහා සී සයාඩෝ හිමියන් විසින් එම රටේ පැවති පැරණි ආරණ්‍ය සම්ප්‍රදයන් මැනවින් හදුරා, මෙම විපස්සනා භාවනා ක්‍රමය සම්පූර්ණ මාර්ගෝපදේශයක් ලෙස සකසා, විපස්සනා නයප්පකරණය නම් අගනා ග්‍රන්ථය එළි දක්වා ඇත.

දැනට පාවුක් ක්‍රමය නමින් හඳුන්වන භාවනා ක්‍රමය මෙන්ම ගොයෙන්කා තුමාගේ භාවනා ක්‍රමයද උපත ලැබුවේ බුරුම දේශයේය. ඊට අමතරව හයවැනි මහා සංඝායනාව බුරුම රටේදී සිදුවීමත්, එයට ලංකාවේ අති පූජනීය පොල්වත්තේ බුද්ධදත්ත, බලංගොඩ ආනන්ද මෛත්‍රීය වැනි හිමිවරුන් වැඩම කොට, ප්‍රසිද්ධියක් ලබා තිබීමත් නිසා, සිංහල බොද්ධයන්ගේ ගෞරව ආදරයට පාත්‍ර වී ඇත. එසේම බුරුමයේ භාවනාකර තිබීම භික්ෂු ජීවිතයේ උසස් තත්වයක් ලෙස පිළිගැනීමක්ද සමහර බෞද්ධයන් අතර පවතී.

කෙසේ වෙතත් අති පූජනීය ධම්මජීව ස්වාමීන් වහන්සේ බුරුමයට වැඩම කිරීම තමන්ට මෙන්ම තවත් බොහෝ දෙනෙකුටත් අති උතුම් ප්‍රතිඵල ලබාදෙන්නක් විය. උන්වහන්සේ අති පූජනීය සයාඩෝ ඌ. පණ්ඩිතාභිවංස හිමියන් යටතේ විපස්සනා භාවනාව පුහුණුවී, දහස් ගණනකට සෙත සලසන භාවනා ගුරුවරයකු හා දක්ෂතම කමටහන් ගුරුවරයකු වීය. එයට අමතරව වර්තමානයේ අති පූජනීය භවනා ගුරුවරයකු ලෙස චිරප්‍රසිද්ධ මහා සී සයාඩෝ ස්වාමීන් වහන්සේගේ විපස්සනා නයප්පකරනය නැමති උපදේශ ග්‍රන්ථය හා අති පූජනීය සයාඩෝ ඌ. පණ්ඩිතාභිවංස මහතෙරුන් විසින් රචිත මේ අත්බවයෙහිදීම (In This very life) හා පූජ්‍ය භික්බු අනාලයෝ විසින් ලියන ලද සතිමත් බව යන පොත් තුන සිංහල බසට පරිවර්තනය කොට සිංහල යෝගාවචරයන්ගේ ප්‍රයෝජනය සඳහා තිළිණ කොට ඇත. ඊට අමතරව බුරුම බසින් පළවූ භාවනා උපදෙස් සහිත ලියවිලි රාශියක් සකසා

භාවනා ලෝකය සරු කෙතක් බවට පත්කිරීමට දායකවී ඇත. මේ අතර පූති මුත්ත භේසජ්ජය හා සතියේ බලමහිමය යන පොත් දෙක අති පූජනීය ධම්මජීව හිමියන් අතින් රචනාවිය. ඊට අමතරව හිමියන්ගේ හරවත් ධර්ම දේශනා ඇතුලත් පොත් රාශියක් ශ්‍රාවකයන් විසින් මුද්‍රණය කොට ධර්ම දානය ලෙස බෙදා හැර ඇත.

පරියප්තිය හා ප්‍රතිපත්තිය යන අංශ දෙකෙහිම මනා පරිචයක් ලබා භාවනා කිරීම හා කරවීම යන දෙකෙහිද පරිපූර්ණ අත්දැකීම් ඇති අති පූජනීය පණ්ඩිතාභිවංශ හිමියන් යටතේ භාවනා පුහුණුව ලැබීම යෝගාවචරයෙක් ලබන උතුම්ම අවස්ථාවකි. අති පූජනීය ධම්මජීව ස්වාමීන් වහන්සේ කල්‍යාණ මිත්‍ර සම්පත්තියේ අනභිබවනීය බව විස්තර කරන්නේ අති පූජනීය පණ්ඩාතාභිවංස හිමියන් ආදර්ශයට ගෙනය. එම දේශනාවට අවධානයෙන් යුතුව සවන් යොමා සිටින විට එම කල්‍යාණ මිත්‍ර ගුණාංගයන් එතරම් සජීව ලෙස අති පූජනීය ධම්මජීව හිමියන් වෙත සම්ප්‍රේෂණයවීම සැබවින්ම ශාසනික සම්පත්තියක් බව සිතේ. කමටහන් ගුරුවරයකු ලෙස අති පූජනීය ධම්මජීව හිමියන් දක්වන දස්කම් බුරුමයේ අති පූජනීය පණ්ඩිතාභිවංස හිමියන්ගේ හා මාතර ඥාණාරම හිමියන්ගේ දක්ෂකම්වල එකතුවක් බව පැවසීම යුක්ති සහගතය.

දෙදහස් පහ වසරේදී ඇති පූජනීය පාඔක් සයාඩෝ හිමියන් හා මහා සී සයාඩෝ හිමියන් ලංකාවට වැඩි අවස්ථාවේදී නිළ පරිවර්තක ලෙස කටයුතු කරන ලද්දේ ධම්මජීව හිමිපාණන් වහන්සේය.

7. සේනාසනයේ භාවනා ප්‍රතිපදාවේ නව නැම්මක්

වර්ෂ එක්දහස් නවසිය අනූහයේදී නිස්සරණ වන සෙනසුණේ සංඝයාගේ ඉල්ලීම පරිදි බුරුමයේ සිට පෙරළා වැඩි අති පූජනීය ධම්මජීව ස්වාමීන් වහන්සේ වර්ෂ දෙදහස් හය පමණවන තෙක් භාවනාවේ යෙදෙමින් සෙනසුනේ සඟපිරිසට විපස්සනා භාවනාව උගන්වන අතරේම පාලි භාෂාව හා ත්‍රිපිටක ධර්මය පිළිබඳව තම අවබෝධය හා පරිචය ශක්තිමත් කරගත්තේය.

නිස්සරණ වනය සෙනසුන සකස්වී තිබුනේ අභ්‍යන්තර වශයෙන් යෝගාවචර ජීවිතය සකස්වීමට මිසක, පිටස්තර ජනතාවට සේවය කිරීම පිණිස නොවේ. පිටස්තර දායකයන් හට අවස්ථාව ලැබුනේ නිස්සරණවන සෙනසුනේ වාසයකරන යෝගාවචරයන් හට සිව්පසය ලබා දීමට පමණි. මෙම තත්වය වෙනස්වී නිස්සරණවන සෙනසුන සුවාසූදහසක් ජනතාවට භාවනාව පුහුණුවන තැනක් බවට පත්වීම ආරම්භ වූයේත්, එම

ප්‍රවනතාවය වර්ධනය වූයේත්, අති පූජනීය ධම්මජීව ස්වාමීන් වහන්සේ නිසාමය. මුලින්ම ආරාධනය පැමිණියේ අති පූජනීය ධම්මජීව හිමියන් ළමා කාලයේ දහම් පාසැල් ගිය, තරුණ කාලයේදී බණ දහම් ඉගෙනගත් පේරාදෙණිය ශ්‍රී සුබෝධාරාම විහාරයෙනි. ඒ වෙසක් පොහොය දවසක බණ දේශනා කිරීමටය. එවකට නිස්සරණවන සෙනසුනේ අධිපති භාවය ඉසුලූ පූජනීය පානදූවේ ඛේමානන්ද හිමියන්ගෙන් අවසර ලැබුනේ පහසුවෙන් නොවේ. කොන්දේසි ගොඩක් සමඟය. කෙසේ වෙතත් ගමන එලදායී වූ අතර, දීර්ඝකාලීන වෙනසකටද, ප්‍රවනතාවයකටද මඟ පෑදුවේය.

එම කාලයේදීම දහම් සාකච්ඡා හා පොත්පත් බෙදදීම නිසා නිස්සරණවන සෙනසුන හා සම්බන්ධව සිටි කමල් ඇඹුල්දෙනිය මහතාද පිරිසක් සමඟ සම්බන්ධව පැමිණ පූජනීය ඛේමානන්ද ස්වාමීන් වහන්සේ මුණ ගැසී අති පූජනීය ධම්මජීව හිමියන්ගේ ධර්ම සේවාව කොළඹ ප්‍රදේශයටත් ලබාදෙන ලෙසට ඉල්ලීමක් කරන ලදී. එම අවස්ථාවේදී එම හිමියන් වහන්සේ අති පූජනීය ධම්මජීව හිමියන්ගේ වටිනාකම මෙන්ම, නිස්සරණවන සෙනසුනේ සාම්ප්‍රදායික වටිනාකමද දක්වමින්, ප්‍රාණයට ප්‍රාණයක් කැපවී වඩම්මවන ලෙසත්, සියලු වගකීම් දරාගන්නා ලෙසත්, වගකීම භාරදෙමින් එකඟ කරගත්තේය.

ඒ අනුව කෝට්ටේ මැටි අම්බලම අසල පෙරපාසැල් ගොඩනැගිල්ලක මාසික වැඩසටහනක් ලෙස ආරම්භකර, පසුව සහභිගිවන පිරිස වැඩිවී ඉඩකඩ මදිවීම නිසා, හේෂාන් සෙන්දනායක මහතාගේ ගෙදරදීත්, කොළඹ 5 දම්රිවි ආයතනයේත්, පසුව ඇලන් මැතිණියාරාම පන්සලේදී මාසිකව වැඩසටහන් පවත්වන ආකාරයට පරිවර්තනය විය. මෙම වැඩසටහන්වල විශේෂත්වය වූයේ ඒවා හුදෙක් ධර්ම දේශනා පමණක් නොව විධිමත් විපස්සනාවට යොමුවන භාවනා වැඩසටහන් වීමය.

දෙදහස් දහය වර්ෂයේදී අම්බුළුවාව භාවනා මධ්‍යස්ථානයේදී දින පහක නේවාසික වැඩසටහනක් තරුණ පිරිසකට පැවත්වුනු අතර එයට යෝගාවචරයන් තිහක පිරිසක් සහභාගිවිය. එම වැඩසටහනේ තේමාව වූයේ ධර්මස්කන්ධයේ ගුණ විස්තර කිරීමය. ඊට පසුව එහිදීම ඥාතීන් සඳහා නේවාසික වැඩමුළුවක් පැවත්වුනු අතර එහි තේමාව වූයේ රථ විනීත සූත්‍රයයි. එතැන් සිට සෑම වර්ෂයකම දින දහයේ නේවාසික භාවනා වැඩසටහන් එකක් හෝ දෙකක් බැගින් අම්බුළුවාව මධ්‍යස්ථානයේදී පවත්වන ලදී.

බුරුම බසත් බුරුමයේ උපත ලැබ ලොව පුරා ව්‍යාප්තවූ භාවනා ක්‍රම පිළිබඳව ප්‍රවීනත්වය ලබාගත් අති පූජනීය ධම්මජීව ස්වාමීන් වහන්සේ එම කුසලතාවයන් නිස්සරණ වනයේ අති පූජනීය ඥාණාරාම ස්වාමීන් වහන්සේ විසින් වගා වර්ධනය කරන ලද භාවනා ක්‍රමවේදය සමග මනාව සුසංයෝග කොට, මේ ජීවිතය තුලදීම අත්හදා බලා ප්‍රත්‍යක්ෂ වශයෙන් ප්‍රතිඵල ලද හැකි භවනා මාර්ගයක්, ප්‍රායෝගික ක්‍රියාකාරකම් සහිතව නිර්මාණය කරන ලදැයි කීම, අතිශයෝක්තියක් නොවන බව පැහැදිලි වන්නේ එහි යෙදෙන විටය.

ගිහිගෙහි දහසක් කටයුතුවලින් නිදහස්ව නේවාසික භාවනා වැඩමුළුවකට සහභාගීවන යෝගාවචරයකුගේ කායික හා මානසික පෙර සූදානම සඳහා පොළඹවන දැණුවත් කිරීමේ වැඩපිළිවෙල එයට සාක්ෂි සපයයි.

එම වැඩපිළිවෙල තුල යෝගාවචරයාගේ සම්පූර්ණ දිනචරියාවම සැලසුම් සහගතය. යෝගාවචර ජීවිතයේ ඉතාම වැදගත් අංගයක්වන කමටහන් ශුද්ධකරගැනීම සඳහා සකසා ඇති වැඩපිළිවෙල යෝගාවචරයා තුළ විශාල දැනුමක් අවබෝධයක් හා උත්ප්‍රේරණයක් ජනිත කරවන සුළුය. කමටහන් වාර්තා ලියන හැටි ඉගැන්වීමම, ජීවිතයේ අනෙකුත් වැඩද ක්‍රමාණුකූලව පිළිවෙලට කරගන්නා හැටි උගන්වයි.

සෑම භාවනා වැඩසටහනක්ම සතිපට්ඨානය වැඩීම මූලික කරගෙනම ක්‍රියාත්මක කිරීම “ඉමාය ධම්මානු ධම්ම පටිපත්තියා බුද්ධං පූජේමි” යන බුදුවදන සහතික වශයෙන්ම ක්‍රියාත්මක කිරීමකි. සෑම භාවනා යෝගියෙකුම වැඩසටහන අවසන්කර පෙරළා යන්නේ ජීවිතයේ හැම ක්‍රියාකාර කමකදීම සතිය වැඩීම පිළිබඳව අධිෂ්ඨානයක් සිත්හි දරාගෙනය.

භාවනා කාලය තුල ගිහිජීවිතයේ සුපුරුදු අංගයන්වන කාර්යබහුල භාවයෙන් හා ගණසංගානිකාරාමතාවයෙන් මිදී හුදකලාව වෙසෙමින් එකම අරමුණක් මත හිත රඳවා ගැනීමට හා විවේක වීමට අවශ්‍ය පාරිසරික පසු බිම වැඩසටහන් තුල ආවේනික අංගයක් බවට පත්වී ඇත. යෝගාවචරයකු වැඩසටහනට පැමිණි මුල් දින දෙකේදී නුහුරක්, පාලුවක් දැණුනද, ධර්ම දේශනාවලට සවන් දෙමින් හා කමටහන් ශුද්ධවන හැටි අත්දකින විට යෝගාවචරයා අභයන්තරයෙන්ම වෙනස්වීමට පටන් ගැනීම ධර්මානුකුල ගමනක ආරම්භයක් බවට පත්වේ.

මේ ආකාරයෙන් නේවාසික වැඩසටහන් දෙසිය හතලිස් හතක් පමණ පවත්වා ඇති අතර, මෙම සෑම වැඩසටහනකටම යෝගාවචරයන් අසූවක් හා සියයක් අතර ප්‍රමාණයක් සහභාගිවී ඇත. කොරෝනා වෛරසය ව්‍යාප්තිය නිසා නේවාසික භාවනා වැඩසටහන් පැවත්වීමට නොහැකිවූ විට අරම්භ කරන ලද සූම් (Zoom) තාක්ෂණය ඔස්සේ ක්‍රියාත්මකවන දුරස්ථ භාවනා වැඩසටහන් මේවන විට (30/9/2021) පනහ ඉක්මවා ඇති අතර ඒ හැම වැඩසටහනකටම සියයකට අධික පිරිසක් සහභාගිවී දෛනික කාලසටහනකට අනුව භාවනා කොට කමටහන් වාර්තා ඉදිරිපත් කරන බවම නිස්සරණ වනයේ අති පූජනීය ධම්මජීව හිමියන්ගේ භාවනා කාර්ය සඳහා ඉටුකරන ලද කාර්යභාරයට හා සාර්ථක කැපවීමට ජීවමාන සාක්ෂියකි

8. ධර්ම දේශනා ප්‍රතිපත්තිය හා ප්‍රතිපදැව

ධර්ම දේශනා ප්‍රතිපත්තිය පිළිබඳවද යමක් සඳහන් කිරීම අති පූජනීය ධම්මජීව හිමියන්ගේ මෙන්ම නිස්සරණවන සෙනසුනේද ප්‍රතිපත්ති දයක හා ප්‍රතිපත්ති ගරුක බවට සාක්ෂියක් වනු ඇත. මීට පෙර පැවති ධම්මපදයේ ගාථාවක් හෝ ජාතක කථාවක් පදනම්කරගෙන ධර්ම දේශනයක් පැවත්වීමේ පිළිවෙත වෙනුවට යෝගාවචර ක්‍රියාවට ගැලපෙන අන්දමේ අදහස් සහිත සූත්‍රයක් පාදක කරගෙන දින කීපයක් එකකට එකක් යා දෙන අන්දමින් ධර්ම දේශනාවලියක් පැවත්වීම තුල යෝගාවචරයාගේ අවබෝධය ක්‍රමිකව වර්ධනය වනු කාය සාක්ෂි ලෙසින්ම දෑකිය හැකිය. සූත්‍ර අනතර්ගතය සතිය වැඩීමේ භාවනා කමටහනක් ලෙස විග්‍රහකිරීම විශේෂ දක්ෂතාවයකි. එම දේශනාවලීන් අතර පුරාභේද සූත්‍රය මුල්කරගෙන කරන ලද දේශනා විසි තුනද, චූල සුඤ්ඤත සූත්‍රය හා අනෙඤ්ජ සප්පාය ආදී සූත්‍ර මුල්කරගෙන කරන ලද දේශනාවන් හා සප්ත බොජ්ජංග ධර්ම මුල්කරගෙන කරන ලද දේශනාවන්ද, අති පූජනීය ධම්මජීව ස්වාමීන් වහන්සේ තුල ධර්ම ඥාණය හා භාවනාමය ඥාණය කෙතරම් දුරට සුසංයෝගවී ඇත්දැයි මනාව ප්‍රකට කරයි. සතිපට්ඨාන සූත්‍රය මුල්කරගෙන කරන ලද දේශනා ඇතුලත් පොත් පෙළ අටුවාවක් වැනිය.

සමස්ථයක් ලෙස ගත්විට ඇති පූජනීය ධම්මජීව හිමියන් ගේ ජීවිතයේ හැරවුම් ලක්ෂය ඇතිවූයේ සුදු ජාතික පූජ්‍ය ධම්මික හිමියන්ගේ උපදෙස් මත සතිය පිහිටවීම පිළිබඳ අදහසත් සමඟමය.

ඒ අනුව අති පූජනීය ධම්මජීව හිමියන් ගේ මුළු පැවිදි ජීවිතයම සතිපට්ඨානය විය. උන්වහනසේ භාවනාකළත්, ධර්මදේශනාකළත්,

කමටහන් ශුද්ධකළත්, ඒ සියල්ලම සතිපට්ඨානය පදනම ලෙස තබාගෙනමය.

“කාලේන ධම්ම සවනං” හා “කාලේන ධම්ම සාකච්ඡා” යයි කියා මංගල සූත්‍රයේ තිබුනත්, අප රටේ සාම්ප්‍රදායික හා ජනප්‍රිය ධර්ම දේශනා හා සාකච්ඡා තුල ඇත්තේ එදිනෙද ජීවිතයේදී පින් සිදුකරගැනීම ගැන හා එම පින් බලයෙන් අනාගත භව වලදී මීට වඩා සැප සම්පත් ලබන ආකාරය පමණය. එයින් සිදුවී ඇත්තේ සාමාන්‍ය ජනතාව තම ජීවිත කාලය පුරාවටම පින් දහම් කරමින් අත්හැරීම වෙනුවට භව තන්හාවෙන් පිරී කල්ගතකොට අවසානයේ අසරණව අනාථව මිය යාමය. මරුවා සමඟ අවසාන සටනේදී පින් පොතේ ලියා ඇති දේවල් පිළිබඳව මතක්කරගැනීමට තරම් සිහියක් පවතින්නේ නැත. මැරුණාට පසුවද ඔහුගේ නමින් පින්කම්ය. සංසාර චක්‍රය නෙනැවතී ඉදිරියටම යන්නේය.

බුදුන්වහන්සේ දේශනාකළ පරිදි “සචිත්ත පරියෝදපනම්” (සිත පිරිසිදු කර ගැනීම) යන්නට ඉඩක් ලබාගන්නේම නැත. එහෙත් නිස්සරණවනය නිර්මාණය කරන ලද ඥානවන්ත පින්වතුන් වන, පූජ්‍ය ධම්ම නිසන්ති හා අති පූජනීය ඥාණාරාම හිමියන්ගේ උතුම් ප්‍රාර්ථනා ඉස්මතුකරමින් අති පූජනීය ධම්මජීව හිමියන් පින් ඇති සියළු දෙනා හට තම සිත පිරිසිදු කරගෙන ධර්මයේ ආලෝකය ලබා සැනසීම උපයා ගැනීමට ආරාධනා කරන්නේය. සමහර දේශකයන් සාමාන්‍ය ජනතාව හට ගැඹුරු ධර්ම කරුණු අවබෝධ කරගැනීමට ශක්තිය නැතැයි කියා, ජනතාව අවතක්සේරුවට පත්කර, දිව්‍ය ලෝක සැප ගැන වර්ණනාකරත්දී, අති පූජනීය ධම්මජීව හිමියන්, ‘අපි දන්නා තැනින් පටන්ගෙන නොදන්නා තැනට යාමට ඉගෙනගනිමු’යි ජනතාව ධෛර්යමත්කරමින් බුද්ධ ධර්මයේ හරය අසන්නාගේ සිත තුළ ශක්තිමත් අයුරින් වගා වර්ධනය කරන ආකාරය ආනන්ද ජනකය. සමස්ත බුද්ධ ධර්මයේ හරය අන්තර්ගතවූ දසුත්තර සූත්‍රය, ධර්ම දේශනා මාලාවන් ලෙස වෙනත් සාධක සූත්‍ර වලින් කරුණු ගෙන හැර පාමින්, අසන්නාගේ සිතේ කෙලෙස් මළ සෝද යන අන්දමින්, වර්තමාන ජීවිතයෙන් උදාහරණ සහිතව කරුණු පැහැදිළිකර පෙන්වන සේක.

මෙයට උදාහරණයක් ලෙස අනුග්ගහිත සූත්‍ර දේශනාවලියේ සඳහන් වැකි කීපයක් උපුටා දක්වමු. ‘භික්ෂුන් වහන්සේලා හැම විටම මනස විවෘතව තියාගන්න ඕනි. එකම අදහසකට සීමාකරන්න හොඳ නැහැ. අප අතර සාධනීය දෙබසක් නැත්නම් ඉදිරි ගමනක් නැහැ. එක තැන මෙට්ටැහි වෙනව. පිහිය මුවහත තියා ගත්තම ඒකෙන් වැඩ ගන්න ඕනි. නැත්නම්

ආයෙත් මළ කනව. හැම ආස්වාසයක්ම, හැම ප්‍රශ්වාසයක්ම, අළුත් එකක් විදිහට බලන්න පුරුදුවෙන්න ඕනි. අද භාවනා කරයි කියල, හෙට නිකං හිටියොත් නිකම්ම මෙට්ටැහි වෙනව. මතුපිටින් පෙනෙන සම්මුති ධර්මයේ තියෙන්නේ ආර්ථික වාසියක් ලබාගන්න හැටි විතරයි. අපි සම්මුති ලෝකය ඇසුරු කරන්නෙ කෑදර කමටයි. ඒකෙන් වෙන්නෙ සංසාරෙට අහුවෙන එක.'

'එනිසා අපි වස්තුවක් දෙස බලල එහි ධර්මතාවය තේරුම් ගන්න උත්සහ කරන්න ඕනි. සම්මුතිය විනිවිදගෙන එම වස්තුවේ අනිත්‍යත්වය, දුක්ඛත්වය, අනාත්මත්වය තේරුම් ගන්න උත්සහ කරන්න ඕනි.'

'ඒ නිසා තමයි කෙනෙකුට පටිසම්භිදා ප්‍රාප්ත වෙන්න නම් පරිපුච්ඡාව තියෙන්න ඕනි. කවදවත්ම තමන් දන්නව කියල හිතන්න එපා. මට වැටහුනේ මෙහෙමයි. ඒක එහෙම ගලපන එක හරිද කියල දැනුම් තේරුම් ඇති අයකුගෙන් අහල සැක දුරුකරගන්නම ඕනි.'

මෙම ක්‍රමවේදය භාවිතා කරමින් නිස්සරණවනය තුළ මෙන්ම ඉන් පිටතත් විධිමත් ලෙස දින හතේ හා පහේ වශයෙන් කළ භාවනා වැඩසටහන් හාරසීයකට අධික ප්‍රමාණයකදී, ධර්මදේශනා දහස් ගණනකදී, පැහැදිළි කරන්නේ, සතිය පිහිටුවාගෙන ජීවිතයේ එදිනෙද කටයුතුවලදී, සතියෙන් යුතුව වැඩකරන්නේ නම් ප්‍රශ්න අඩු බවය. ජීවිතය බරක් නොවී සැහැල්ලුවෙන් ගෙවිය හැකි බවය.

අති පූජනීය ධම්මජීව හිමිපානන් වහන්සේ බුද්ධ ධර්මයේ ගැඹුරු හරය හෙවත් "ඒහි පස්සික ගුණය, ඕපනයික ගුණය හා පච්චත්තංවේදීතබ්බෝ ගුණය," ඉස්මතුකර දක්වමින් ශ්‍රාවකයා හට සම්මුතිය හා පරමාර්ථය විනිවිද යාමට උනන්දු කරවන්නේය.

පුරාබේද සූත්‍රය පදනම් කරගෙන පවත්වන ලද ධර්ම දේශනා විසි තුන ශ්‍රවණය කර අවසන්කරන විට, යෝගාවචරයා තම සිතින් නිවන ස්පර්ශ කරන තත්වයට පත්වන ආකාරයෙන් සිත ශ්‍රද්ධාවෙන් හා ධර්ම ඥාණයෙන් මුහුකුරා යන ආකාරයට පැවත්වීම අති පූජනීය ධම්මජීව හිමියන් සැබැවින්ම අවබෝධය ලබා ඇති බවට/කෙලෙස් සංග්‍රාමයෙන් ජය ලබා ඇති බවට සාක්ෂියක් ලෙස ගතහැකිය. චූල සුඥ්ඥත සූත්‍රය දේශනය අතර මගදී අති පූජනීය ධම්මජීව හිමියන් පවසන්නේ එවැනි දේශනාවන් ආධුනික මනසකට ටිකක් බර වැඩි වූවත් ක්‍රමාණුකූලව ධර්ම ඥාණය මෝරන විට අවබෝධවීමට අවස්ථාව උදවන බවත්ය. වඩා හොඳ දෙයින්, හොඳ දෙය ප්‍රතිස්ථාපනය කිරීමේ ක්‍රමවේදයට අනුව යන මෙම ධර්ම

චාරිකාව, යෝගාවචරයා හට සම්මුතිය හා පරමාර්ථය විනිවිද දැක අවබෝධය ලබාගැනීමට උපකාරවන බවට පසුගිය කාලය තුල කාය සාක්ෂි ලෙස දැක ඇත්තෙමි.

අති පූජනීය ධම්මජීව හිමිපානන් ධර්මයේ ඇති ගැඹුරු අදහස් හා සංකල්ප ශ්‍රාවක මනස තුලට කාවද්දන්නේ ඉතාම සිත්ගන්නා ආකාරයෙන්ය. උදාහරණයක් ලෙස චංකි සූත්‍රයේ එන කාපටික නම් ත්‍රිවේද ප්‍රාප්ත බමුණු තරුණයා හා බුදුන් වහන්සේ අතර ඇතිවන සංවාදය උපයෝගී කරගනිමින් කිසියම් ආගමික සංකල්පයක ඇති හරයාත්මක ගැඹුරුබව හා ප්‍රායෝගික භාවිතය පිළිබඳව විස්තර කරන ආකාරය අපූරුය. සංවාදයේ අවසානයට යන විට ඒ සඳහා සුදුසුම ගුරුවරයා තෝරාගැනීම සඳහා සුදුසු උපදෙස් මාලාවකි.

- ගුරුවරයා කියන දේ කරන හා කරන දේ කියන වගවීමක් සහිත අයකු වීම
- ගුරුවරයා විසින් ඉදිරිපත් කරන සංකල්පය හෝ ක්‍රමවේදය ගුරුවරයා විසින් අනුගමනය කොට ප්‍රතිඵල ලබා තිබීම
- අවම වශයෙන් තවත් එක් අයකු හෝ එම ක්‍රමය අනුගමනය කොට ප්‍රතිඵල ලබා තිබීම
- ඕනෑම අයෙකුට ප්‍රායෝගිකව යෙදීමෙන් ප්‍රතිඵල ප්‍රත්‍යවේක්ෂණය කළ හැකිවීම ආදිය දක්වයි.

එම සංවාදය අවසන්වන විට අති පූජනීය ධම්මජීව හිමිපානන් ද බුදු මඟ නිවැරදිව අනුගමනය කර ප්‍රතිඵල ලබා ඇත්තකු බව හෙළිවීම වැලක්විය නොහැකිය.

ධර්ම දේශනා ගැන සඳහන්කරන විට විශේෂයෙන් සඳහන්කළ යුක්තක්නම් අති පූජනීය ධම්මජීව හිමියන් කිසිම හේතුවක් නිසා තම මූලික අරමුණින් බැහැර නොවන බවය. මේ සඳහා දක්විය හැකි හොඳම උදාහරණය නම් මෑතකදී තම සොහොයුරාගේ අභාවය මුල්කරගෙන ඥාතීන් හා හිතවතුන් මුල්වී සංවිධානය කරන ඥාතකා ධර්ම දේශනාවකදී පැවසූ අදහස්ය. 'ඥාතියා උනත්, කවුරු උනත්, බුදුන් වහන්සේගේ දේශනාවට අනුව කළ යුත්තේ සතිපට්ඨානය වැඩීමයි. කවුරු උනත් මාත් එක්ක සම්බන්ධ වෙනවනම්, ඒ සතිපට්ඨානය වැඩීම හා කමටහන් සුද්දකිරීම හරහා තමයි. වෙන සම්බන්ධකම්වල තේරුමක් නැහැ.'

අති පූජනීය ධම්මජීව හිමියන් දියුණු පමුනු කරගෙන ඇති ගැඹුරු ධර්ම ඥානය හා විශ්ලේෂණ ශක්තිය හොඳින්ම හෙළි වන්නේ නිවනේ නිවීම

දේශනාවලිය පිළිබඳව නිස්සරණ වනයේදී කරනු ලබන සමාලෝචන සාකච්ඡා මාලාවෙහිදීය. පූජනීය කටුකුරුන්දේ ඤාණනන්ද හිමියන් විසින් ශ්‍රාවක සිත් සතන් රැගෙන ගියාට වඩා වැඩි ගැඹුරකට ගෙන ගොස්, නිවන සාක්ෂාත් කරගැනීමේදී පුද්ගල සන්තානය පැවතිය යුතු කෙලෙස් රහිත සුපිරිසිදු භාවය හා ඊට සමගාමීව සැබැවින්ම පැවතිය හැකි සාපේක්ෂව කෙලෙස් රහිත තත්වය පිළිබඳව ධර්මාණුකූල මඟ පෙන්වීමට අති පූජනීය ධම්මජීව හිමියන් සමත්වන්නේය. ඒ පිළිබඳව සාකච්ඡාවක් ආරම්භ කිරීම බොහෝ ඉඩ කඩ ඉල්ලා සිටින කාර්යයක් හෙයින් එය පසුවට කල් තබමු.

එක් එක් සූත්‍ර දේශනාවක් ආශ්‍රයෙන් කරුණු දැක්වීම විචිත්‍ර උවත් රචනය දිග් ගැහෙන නිසා මෙම ප්‍රායෝගික උදාහරණ ප්‍රමාණවත්යයි සිතමි.

යෝගාශ්‍රම සංස්ථාවේ කථිකාවත ව්‍යවස්ථාව ලියූ එහි ප්‍රථම උපාධ්‍යයන් වහන්සේවූ අති පූජනීය මාතර ඤාණාරාම හිමියන් වැඩසිටියේ මීතිරිගල නිස්සරණවන සෙනසුනේය. ආරම්භයේ සිට අද දක්වාම එම ව්‍යවස්ථාව කථිකාවත සතියකට වරක් සඟ පිරිස එකතුවී කියවීම පුරුද්දක් කරගෙන තිබීම සංස්ථාවේ නිර්මාතෘන් හට දක්වන ගෞරවයකි. ඒ අතරම අති පූජනීය මාතර ඤාණාරාම හිමියන්ගේ මඟ පෙන්වීමට අනුව යෝගාවචර දින චරියාව ඉටුකරන නිස්සරණවන සෙනසුට අනුබද්ධව තවත් සේනාසන තුනක් විජිතපුර, ඉමදූව හා කඩුවෙල පවත්වාගෙන යාම අති පූජනීය ධම්මජීව හිමියන් විසින් අනාගතය වෙනුවෙන් ඉටුකරනු ලබන අගනා මෙහෙවරකි. මෙම ස්ථාන හතරේම වැඩවාසය කරණු ලබන සංඝයා සතියකට වරක් නවීන සූම් තාක්ෂණය පදනම් කරගනිමින් අති පූජනීය ධම්මජීව හිමියන්ගේ ප්‍රතාපවත් නායකත්වය යටතේ ධර්ම විනය කරුණු සාකච්ඡා කිරීම ගරු කටයුතු සාසනික මෙහෙවරකි.

9. භාවනා වැඩසටහන්

අති පූජනීය ධම්මජීව හිමිපානන් විදේශීය රටවල පවත්වන ලද භාවනා වැඩසටහන් ප්‍රමාණයද සියය ඉක්මවා ඇත. සෑම වසරකම නියමිත කාල පරිච්ඡේදයකදී ඉතා සංවිධානාත්මක ආකාරයෙන් යුරෝපය, ඇමරිකාව, ඔස්ට්‍රේලියාව හා නවසීලන්තය ආවරණය වන ආකාරයට කාලසටහන සකසා, ගමන් කරන කාලය හැර එක් නිවාඩු දිනයකුදු නොලබාම විවිධ දේශගුණ තත්වයන් යටතේ නේවාසික යෝගාවචර පිරිසේ ධර්ම හා භාවනාමය ඥානය වර්ධනය වන ආකාරයට වැඩසටහන්

කිරීමට අවශ්‍ය කායික හා මානසික නිරෝගීභාවය ලැබෙන්නේ "ධම්මෝ හවේ රක්ඛති ධම්මචාරී" යන ධර්මෝපදේශයට අනුව විය යුතුය.

අති පූජනීය ධම්මජීව හිමිපාණන් කමටහන් සුද්දකරන ආකාරය විස්තර නොවුනහොත් එම හිමියන්ගේ සාසනික සේවාව හා භාවනාව පිළිබඳව ලියන සටහනක් සම්පූර්ණ වන්නේ නැත. අති පූජනීය ධම්මජීව හිමියන්ම පවසන්නේ 'වණ මුඛය හොඳින් පාදා පිරිසිදුකර බෙහෙත් දැමීම තුලින් පමණක් තුවාලය සුවවන බවය.' ඒ අනුව කමටහන් සුද්ධකිරීමේදී යෝගාවචරයාගේ සැබෑම මානසික තත්වය හෙළිවන තුරු ප්‍රශ්ණ ඇසිය යුතු බවය. අති පූජනීය ධම්මජීව හිමියන් මෙම ක්‍රියාවලිය හඳුන් වන්නේ 'උසාවියට කැඳවීම' ලෙසය. ආරම්භයේදී යෝගාවචරයා හට නුහුරක් හා කෝල ගතියක් දැණුනද, එහිදී අසනු ලබන ඍජු ප්‍රශ්නවලට පිළිතුරු දීම හරහා තමාගේ සිත කෙළෙස්වලින් මිදී පිරිසිදුවනු දකින විට යෝගාවචරයා ආනන්දයෙන් ප්‍රඥාවට ගමන්කරන ආකාරය තමන්ම අවබෝධ කරගන්නේය. මෙම ක්‍රමවේදයේ විශේෂ වාසිය නම්, එක් යෝගාවචරයකුගේ කමටහන ශුද්ධවන විට නිරායාසයෙන්ම තවත් බොහෝ දෙනෙකුට එම දැනුම සම්ප්‍රේෂණය වීමය. මේවනවිට ස්වාමීන් වහන්සේ දහස් ගණනකගේ කමටහන් ශුද්ධකරගැනීමට මඟ පෙන්වා ඇති අතර, උපුටාගත් ප්‍රශ්ණෝත්තර ඇතුළත් ග්‍රන්ථයක් සියපත සියපැන නමින් පළකර ඇත. අති පූජනීය ධම්මජීව හිමියන්ගේම භාෂාවෙන් උපුටා දක්වන්නේනම්, 'හැදිච්ච ගෙදර නැහැදිච්ච තරුණයා' යෝගාවචර ජීවිතයට යොමු වූයේ සුදු ජාතික පූජ්‍ය එස්. ධම්මික හිමියන් විසින් සතිය පිළිබඳව පාඩම කියා දීමෙන් පසුවය. පියතුමන්ගේ අභාවය ඇතුලු විවධ හේතුකාරණා නිසා ජීවිතයට නව මානයක් සොයමින් සිටි තරුණයා එම පණිවිඩය නියමාකරයෙන් අවබෝධ කරගෙන ගිහි ජීවිතයෙ සම්බාධක සහිත භාවය හා අර්ථ විරහිත ස්වරූපයද අවබෝධ කරගනිමින්, ජීවිතයේ සුන්දරතම අවදියේදි වෙහෙස මහන්සියෙන් උපයා, සපයාගත්, දැන උගත්කම මෙන්ම, වෘත්තීය පළපුරුද්දද, අළුයම ලූ කෙල පිඩක් මෙන් ඉවත දමා, වනගතව වසර තිහකට වැඩිකාලයක් සතිමත් බව වැඩීය. මෙම කැපවීමේ හා උත්සහයේ ප්‍රතිඵල සමාජය වෙත බෙදා දීමේදී නිර්ලෝභී හා අනලස්වූ ආකාරය ඉහත සඳහන් තොරතුරුවලින් සනාථවේ.

යථාවාදී තථාකාරී ගුණය බුද්ධ දර්ශනයේ උතුම්ම ගුණාංගයකි. මෙම ගුණය අති පූජනීය ධම්මජීව හිමිපාණන් තුළ මැනවින් පිහිටා ඇති බව ජීවිත පැවත්ම තුළින්ම ප්‍රකාශවී ඇත. බුද්ධ ධර්මයේ උගන්වනු ලබන අනිත්‍ය දුක්ඛ හා අනාත්ම දර්ශනය උගන්වනවා සේම, එය පුද්ගලිකව හා ප්‍රායෝගිකව පිළිගැනීම අති පූජනීය ධම්මජීව හිමියන්ගේ ජීවන රටාවය.

මෙයට හොඳම උදාහරණයනම්, අති පූජනීය ධම්මජීව හිමියන් කොරෝනා වෛරසය පැතිරීමේදී දැරූ හා අනුගමනයකරන ලද ආකල්පය හා ක්‍රියා කලාපයයි. විෂබීජ ව්‍යාප්තිය ආරම්භයේදීම සෑම රටකම පාහේ සිය දහස් ගණනින් මැරී වැටෙන විට, මුළු ලොවම බියෙන් සලිතවී හඬා වැටෙන විට, උන්වහන්සේ ප්‍රකාශකර සිටියේ ස්වභාව ධර්මයේ විවිධ ප්‍රවනතා වරින් වර මතුවී නැවත යටපත්වන බවය. මීට පෙරද චිකන් ගුන්න්‍යා, ඇන්ත්‍රැස් ඩෙංගු වැනි රෝග තත්වයන් පැමිණ මැකී ගියා සේම කොරෝනාවද මැකී යනු ඇති බවත්, එනිසා ආරක්ෂක ක්‍රම පිළිපදිනවා මිසක ප්‍රමාණය ඉක්මවා කළබල නොවිය යුතු බවත්ය. අද වන විට ස්වභාව ධර්මය විසින්ම එම තත්වය තහවුරුකර ඇත. හිමියන්ගේ යථාවාදී තථාකාරි ගුණය වඩාත් හොඳින් පැහැදිලිවන සිද්ධියක් මෙහි සඳහන් කරන්නේ එම අවංක අව්‍යාජ ගුණයට ගරුකිරීමක් ලෙසය. වර්ෂ දෙදහස් දා හතේදී පමණ දිනක් පහල ධර්ම ශාලාවේ හවස ධර්ම දේශනය අවසන් කරමින් කියා සිටියේ අනිත්‍ය බව නිතරම පිළිගත යුතුයි. ‘දැන් මම මේ ධර්ම දේශනය හමාර කර උඩහ කුටියට වැඩම කරන විට සර්පයෙක් දෂ්ඨකර මරණයට පත්උවහොත් මරණ පරීක්ෂණ හෝ ජීවිත රක්ෂණය හෝ ගැන කතාකිරීම තේරුමක් නොමැති කථාවකි.’ එනම් ජීවිතයේ නොතිර බව නිතරම සිහි තබාගත යුතු බවය. තමන් පිළිබඳ විශ්වාසය විනා වෙනත් කිසිම බාහිර බලවේගවල පිහිට පිළිබඳ විශ්වාසයක් අති පූජනීය ධම්මජීව හිමියන් තුල කිසිම දිනක විද්‍යාමානවනු දැක නැත්තෙමි.

10. සති පාසල

අති පූජනීය ධම්මජීව හිමිපාණන් විසින් සමාජයට ප්‍රධානය කරන ලද උසස්ම හා උතුම්ම දායාදය නම්, වාණිජවාදයේ හා තොරතුරු තාක්ෂණික මෙවලම්වල අසීමාන්තික බලපෑම නිසාම වියවුල්ව ගිය සමාජයක මානසික විඩාවෙන් හා අසහනයෙන් පීඩාවට පත්වෙමින් සිටි පිපෙන කැකුළු වැනි දූ දරු පරම්පරාව වෙත සිහියේ (සතියේ) බලමහිමයෙන් අසහනයෙන් මිදී සුව පත් විවේකී මනසකින් ජීවිතයට මුහුණ දෙන හැටි කියා දීමට මුල පිරීමය. මෙම ක්‍රියාවලිය ආරම්භ කිරීමේදී පවතින සම්ප්‍රදායික මතවාදයන්ට සාපේක්ෂකව මුහුණ දීමට සිදුවූ ප්‍රධාන ගැටලු දෙකකි.

බුද්ධ ධර්මයේ එන ප්‍රධාන සංකල්ප වලින් එකක් වන සතිය සංකල්පය එතරම් පහසුවෙන් හය හතර නොතේරෙන දරුවන් අතට පත්කිරීම සම්බන්ධව සම්ප්‍රදායික බෞද්ධ සමාජයේ තිබුණු ආකල්පයට මුහුණ දීමය. ඒ සඳහා අති පූජනීය ධම්මජීව හිමියන් යොදාගත්තේ පූජනීය

ඥාණපෝණික ස්වාමීන් වහන්සේ විසින් හඳුන්වා දී තිබුණු සති මාත්‍රය (Bare attention) යන්න යොදා ගැනීමයි. දෙවනුව පැමිණි ප්‍රශ්නය නම් සුපිරිසිදු ශීලයකින් තොරව සතිය වැනි ආගමික වටිනාකමක් ඇති සංකල්පයක් හඳුන්වා දීම සුදුසුද යන්නය. ජාත්‍යන්තර දැනුමින් මෙන්ම දිගුකාලීන භාවනාමය ඥාණයෙන්ද පරිපූර්ණවී සිටි හිමියන් එම තත්වය පැහැදිළි කරන ලද්දේ, පුද්ගලයකු සතිමත්වන විට ඇතිවන මානසික මුහුකුරා යාම තුළ, තමාවම උපමාවට ගෙන සිතීම තුළින්, සමාජ සදාචාර ධර්මවලට ගරුකිරීමට පුරුදුවන බවත් එමඟින් ස්වයං ශික්ෂණයක් ඇතිවන බව පෙන්වා දීමයි. සති පාසැලේ ක්‍රමික වර්ධනය හා ව්‍යාප්තිය සමඟ ඉහත සඳහන් කරුණු දෙකම ප්‍රායෝගිකව සනාථවීම අති පූජනීය ධම්මජීව හිමිපාණන්ගේ දුරදක්නා හා පරිණතවූ ඥාණයේ සප්‍රමාණික බව පෙන්වීය.

දැනට ජාතික මෙන්ම ජාත්‍යන්තර තලයද වසාගත් අතුපතර විහිදුවාගත් මහා රැකක් ලෙසින් පෙනෙන සති පාසැල සංකල්පය ප්‍රායෝගිකව ආරම්භ කළේ ඉතාම සරල ආකාරයෙන්ය. දෙදහස් පහළොව වර්ෂයේ අගෝස්තු මාසයේ දිනක හවස් වරුවේ මීතිරිගල අවට දහම් පාසැල් දරුවන් පිරිසක් එකතුකරගත් අති පූජනීය ධම්මජීව හිමියන්, සතිමත් බවේ වටිනාකම හා එය පුහුණුවන ආකාරය සාකච්ඡාකර, ප්‍රායෝගික පුහුණුවක් කරන ලදී. ඒ මාසයේම විසිපස්වන දින ළමුන් ගුරුවරුන් හා දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මකවිය.

ඊ ලඟ පියවර ලෙස දෙම්පේ අධ්‍යාපන කොට්ඨාශයේ විදුහල් හතලිස් අටක විදුහල්පතිවරු හා ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් කිරිදිවෙල මහා විද්‍යාලයේදී පවත්වන ලදී. එයට වෛද්‍ය තරා ද මෙල් මහත්මිය හා මහාචාර්ය ලක්ෂමන් ජයතිලක මහතාද සහභාගිවීම විශේෂයක්විය.

ඊට පසුව වෛද්‍ය තාරා ද මෙල් මහත්මියගේ සහභාගිත්වය මඟින් කොළඹ ප්‍රෙස්බිටීරියන් විද්‍යාලයේදී කොළඹ අවට විදුහල්වල විදුහල්පතිවරු හා ගුරුවරු සමඟ සති පාසැල පිළිබඳ සාකච්ඡාවක් පැවත්විණි. එහි ප්‍රතිඵලයක් ලෙස කොළඹ කතෝලික පාසැලක්වූ ප්‍රෙස්බිටීරියන් පාසැලේ ළමුන් සඳහා සතිය පුහුණුවීමේ වැඩසටහනක් පැවත්වීය. ඉන් ඉක්බිති කොළඹ විශාකාව ඇතුලු විද්‍යාලවලත්, පළාත් බද පාසැල් රාශියකත්, ළමුන් සඳහා සතිමත් බව පුහුණුකිරීමේ වැඩසටහන් පැවත්වීය. මෙම ව්‍යාප්තිය සමඟ දෙම්පේ ප්‍රදේශයේ මෙන්ම

පාලින්ද නුවර පාසැල් විසි අටක ළමුන් සඳහා සති පාසැල පුහුණුකිරීම් කරන ලදී.

ළමුන් සඳහා සතිමත් බව හඳුන්වා දීමේදි භාවිතා කරන ලද සුවිශේෂී සංකල්පයක් වූයේ ආරක්ෂාව පිළිබඳ කටයුත්තේදී ඉබ්බා ක්‍රියාත්මකවන ආකාරය පැහැදිලිකිරීමය. තමන් අනතුරකට මුහුණ දී ඇතැයි තේරුම් ගත් විගසම ඉබ්බා කරන්නේ තම හිස සහ අඬු ටික කටුව ඇතුලට දමාගෙන නිසොල්මනේ සිටීමයි. එයම උපයෝගී කරගනිමින් වර්තමානයේ ජනප්‍රිය වචනයක් බවට පත්වී ඇති SMS යන්නට නව අර්ථකතනයක් දෙන ලදී.

Slowly- සෙමින්- නැවතිල්ලේ

Mindfully- සතිමත්ව

Silently - නිශ්ශබ්දව

මෙම කෙටි යෙදුම දරුවන් අතර ජනප්‍රිය පාඨයක් බවට පත්වී සති පාසලේ තේමාවක් විය.

ආරම්භයේදී සතිමත් වාඩිවීම හා සතිමත් ඇවිදීම යන ක්‍රියාකාරකම් දෙකකින් හා උත්තේජ ජනක කෙටි දේශනයකින් ආරම්භවූ මෙම වැඩසටහන්, අත්දැකීම හා දැනුම මුහුකුරා යනවිට සතිමත් ආහාර ගැනීම, සති ක්‍රීඩා ආදිය ඇතුලුවී පූර්ණ සති සංවර්ධන වැඩසටහන් බවට පරිවර්තනය විය. ඒ අතර අති පූජනීය ධම්මජීව ස්වාමීන් වහන්සේගේ භාවනා පුහුණු වැඩසටහන්වලට සහභාගිවන ඕස්ට්‍රේලියාවේ යෝගාවචරයින් හා ඔවුන්ගේ දරුවන් සති පාසැලට සම්බන්ධවීම නිසා සති පාසැල් සකෙල්පය නව තාක්ෂණික දැනුම හා නවීන තම සති ක්‍රීඩාවලින් පෝෂණයවී, සහභාගිවන දරුවන්ගේ පෞරුෂය වර්ධනයවී, පහසුවෙන් අභියෝග ජයගතහැකි ආවේග පාලන හැකියාවෙන් යුත් ශක්තිමත් මානසික තත්වයක් වර්ධනයවන වැඩසටහනක් බවට පත්විය.

කැළණි ගඟ අසබඩ මිටියාවතේ පිහිටි සුන්දර බිම්කඩක් සීලවති හෙට්ටිආරච්චි මහත්මිය විසින් සති පාසලට ලැබීමත් සමඟ බාලදක්ෂ කඳවුරුවල ස්වරූපය ගත් සති කඳවුරු පැවත්වීමට හැකිවීම නිසාත්, පාසැල් ළමුන් සිය ගණනකට එකම බිමක සහෝදර බැම්මෙන් බැඳී සතිමත්ව විවිධ ක්‍රීඩාවල යෙදීමට අවස්ථාව ලැබීම නිසාත්, සතිඅන්ත දිනවලදී දරුවන් සිය ගණනින් කඩුවෙල පිහිටි සති කඳවුරු භූමියට රැස්වීමට පුරුදුවිය. දෙමාපියන්ද විභාග කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමය නිසා පීඩාවට හා අසහනයට පත්වී සිටින තම දරුවන් හට සහනශීලී

මිත්‍රත්වයෙන් හා සුහදතාවයෙන් පිරි ආත්මාර්ථකාමී තරඟය වෙනුවට, සහයෝගයෙන් අභියෝග ජය ගැනීමේ කලාව පුහුණුකිරීම සඳහා කඩුවෙල සති පාසැලට රැගෙන ඒමේ පුරුද්දක් ඇතිවිය.

සති පාසැල සංකල්පය ජනගතවී දරුවන් සඳහා වූ සුහදශීලී වැඩසටහනක් බවට පත්වන විට සති පාසැල සංකල්පය හා ක්‍රියාකාරකම් ගුණාත්මක අතින් වර්ධනය වීමේ වැඩසටහන් අති පූජනීය ධම්මජීව හිමිපාණන්ගේ උපදෙස් මත ක්‍රියාත්මකවිය. පාසැල්වල සතිමත්වීමේ වැඩසටහන් සඳහා ඉල්ලුම වැඩිවන විට සති පුහුණුකරුවන්, පුහුණු කිරීමේ වැඩසටහන්ද විධිමත් අයුරින් සංවර්ධනය විය. පුහුණුකරුවන් සඳහා ළමා මනෝ විද්‍යාවේ මූලික හා ප්‍රායෝගික දැනුම ඇතුලත් පාඨමාලාවක් පවත්වා, සිය ගණනක් පුහුණුකරුවන් දැනුමින් හා කුසලතාවයෙන් පිරිපුන් පිරිසක් බවට පත්කිරීමට හැකිවිය.

සතිපාසැල සංකල්පය නිර්මාණය කර දරුවන් හට තිළිණ කිරීමේදී අති පූජනීය ධම්මජීව හිමිපාණන්ගේ සිතේ දරුවන් කෙරෙහි කෙතරම් දයානුකම්පාවක් තිබුනේද යන්න පැහැදිලි වෙන ප්‍රකාශයක් සිහිගැන්වීම කාලෝචිතයයි සිතමි. සති ක්‍රීඩා සැලසුම් කිරීමේදී බුද්ධි වර්ධනයට බෙහෙවින් උපකාරවන දම් ක්‍රීඩාව, චෙස් ක්‍රීඩාව වැනි ක්‍රීඩා ඇතුලත් නොකිරීමට තීරණය විය. එයට හේතුව වශයෙන් අති පූජනීය ධම්මජීව හිමිපාණන් පෙන්වා දෙන ලද්දේ සති ක්‍රීඩා මඟින් ළමා මනස තුල වර්ධනය විය යුත්තේ, ජයෙන් ජය ලබන තරඟකාරිත්වය නොව, බෙදා හදාගැනීමෙ හා සහයෝගීතාවයෙන් වැඩකරගැනීමේ පුරුද්ද වගා වර්ධනය වන ක්‍රීඩාවන් බවය. එම තත්වය බුද්ධ දර්ශනයේ එන සතර සංග්‍රහ වස්තු, එනම් දානය, ප්‍රිය වචනය, අර්ථචරියාව හා සමානාත්මතාවය යන ගුණ ධර්ම ළමා මනසේ පැලපදියම් වීමට උපකාරවන බවය.

පාසැල් දරුවන් අරමුණු කරගෙන සති පාසැල සංකල්පය නිර්මාණය වූවත් එහි උපයෝගීතාවය ප්‍රකටවන විට සමාජයේ ආතතියට හා අසහනයට ගොදුරුවූ අනෙකුත් වෘත්තීය කණ්ඩායම්ද සති පාසැලේ පිහිට සොයා කඩුවෙල බෝමිරියේ සති පාසැල පරිශ්‍රයට පැමිණීමට පටන් ගත්හ. නිතරම අපරාධ කල්ලි සමඟ ගැටීමට සිදුවන පොලීසියේ නිළධාරී මහතුන් මුලින්ම පැමිණි අතර, සතිමත්ව සේවයට පිවිසීම තුලින් තමන්ගේ ආතතිය කළමනාකරණය කර ගැනීමට මෙන්ම, තම සේවාදායකයන් හට ඵලදායී සේවාවක් සැපයීමේ කුසලතාවයද ලැබෙන බව වටහාගත් එම නිළධාරී කණ්ඩායම, සියලුම පොලිස් නිළධාරීන් හට එම අවස්ථාව ලබාදීම සුදුසු බව නිර්දේශ කළහ.

නිරන්තරව වෘත්තීය ආතතියට පත්වන තවත් කණ්ඩායමක්වන බන්ධනාගාර නිළධාරීන්ගෙන් ආරම්භ වූ සතිමත්ව සේවාවට පිවිසීමේ වැඩසටහන්, මේ වනවිට මත්ද්‍රව්‍ය වලට ගොදුරු වූවන් පුනරුත්ථාපනය (විශෝධනය) සඳහා සතිමත් බව සාර්ථකව යොදගත හැකිය යන අදහස ක්‍රියාත්මක වෙමින් පවතී. බන්ධනාගාර තුළ රැඳවියන් මෙන්ම නිලධාරීන් සතිමත් භාවනාවට යොමුවී සිටිනු දකිය හැකිය. මේ අයුරින් සමාජයේ හැම ක්ෂේත්‍රයක්ම ආවරණය වන පරිදි සතිමත්බව එදිනෙද කාර්යයන් සඳහා සාර්ථකව යොදගත හැකිවීම "**ඒකායනෝ අයං භික්ඛවේ මග්ගෝ චත්තාරෝ සතිපට්ඨානා**"යන බුදු වදන ප්‍රායෝගික සත්‍යයක් හා යථාර්ථයක් බව සනාථකර දක්වීමට අති පූජනීය ධම්මජීව හිමිපාණන් සමත්වී ඇත.

දෙදහස් දහ අටේදී ලංකාවේ සති පාසැල පදනම මඟින් සංවිධානයකරන ලද සතිමත් බව පිළිබඳ ජාත්‍යන්තර සමුළුව (Global Summit on Mindfulness) මඟින් ජාත්‍යන්තරයේදී හා බටහිර රටවල අධ්‍යපන හා සමාජ වෘත්තීය සංවර්ධනය සඳහා සතිමත් බව යොදගැනීම පිළිබඳව පුළුල් දැක්මක් හා අවබෝධයක් ලබාගැනීමට හැකිවිය.

මෙම සමුළුව පවත්වන කාලයේදී මහා බ්‍රිතාන්‍ය සති සංකල්පය සමාජ සංරක්ෂණය සඳහා යොද ගැනීමේදී ලංකාවට ඉදිරියෙන් සිටියත්, මෑත කාලයවන විට ලංකාවේ සති සංකල්පය ප්‍රායෝගිකව යොදගැනීම වඩාත් සාර්ථක නිසා, එම ක්‍රමය අනුගමනය කිරීම සඳහා ලංකාවේ උපදෙස් ඉල්ලා සිටීම අති පූජනීය ධම්මජීව හිමියන්ගේ සතිපාසැලේ සාර්ථක භාවය ප්‍රායෝගිකව සනාථවීමකි.

මෙම සියලුම කටයුතු කිසිම ආකාරයක මුදල්මය ප්‍රතිලාභ වලින් තොරව පරිත්‍යාගය මුල්කරගත් ස්වේච්ඡාවෙන් කැපවූ පිරිසක් අතින් සිදුවීම අති පූජනීය ධම්මජීව හිමිපාණන්ගේ උත්තරීතර නායකත්වයේ හා මඟ පෙන්වීමේ විශිෂ්ඨතම ප්‍රතිඵලයකි.

සති පාසැල සංකල්පය බිහිවීම හා සංවර්ධනය වීම ලංකාවේ අධ්‍යාපන ප්‍රතිපත්ති සංශෝධනයේ ලා ඉමහත් බලපෑමක් ඇතිකිරීමට අවස්ථාව ලැබීම එක්තරා අන්දමක දෛවෝපගත සිද්ධියක් බවට පත්වෙමින් පවතී. දසක ගණනාවක් තිස්සේ එක තැන පල්වෙමින්, සිසු දරුවන්ට හා ගුරුවරුන්ට මෙන්ම අධ්‍යාපන පරිපාලකයන් හටද ආතතිය හා අසහනය නිර්මාණය කළ පන්තිකාමර අධ්‍යාපනයේ වෙනසක් ඇතිකිරීමට ජාතික අධ්‍යාපන ආයතනය ගන්නා ක්‍රියාමාර්ගයන් හට සැලකිය යුතු ධනාත්මක වෙනසකට සති පාසැල සංකල්පය හරහා කරන ලද යෝජනා පිළිගෙන



27-9. 88

සුමිනා නංගීටයි

සුමිනේ !

ප්‍රිය ඇසුවාවූ ඔබගේ බාල පුතා මෙසේ සිතුවේය

"ගෙදර ජීවිතය [illegible]-සම්බාධය, කෙලෙස් උපදනා තැනකි, පැවිද්ද අවකාශය (හිස් අහස සේ) ය. ගිහිගෙයි වසන්නාවූ කෙනෙකුට, පරිපූර්ණවූ, පිරිසිදුවූ ශුද්ධ වලම්පුරියක් බඳුවූ [illegible] බ්‍රහ්මචරියාව වසන්නට පහසු නොවේ. මම ~~[illegible]~~ කෙස් රැවුල් කපා කසාවත හැඳ පොරවා, ගිහිගෙයින් නික්ම බුදු ශාසනයෙහි පැවිදි වන්නේ නම් හොඳයි"

මෙසේ සිතා අල්ප වූ හෝ වස්තු සම්භාර හැර මහත්වූ හෝ වස්තු සම්භාර හැර අල්ප වූ හෝ නෑදෑ පිරිස හැර මහත් වූ හෝ නෑදෑ පිරිස හැර ගිහිගෙයින් නික්මුණේය.

අතිශය ශීල සම්පන්න පඬිවර, [illegible], ගුණවැඩි අප ලොකු හාමුදුරුවන් වහන්සේ ළඟ කාලයක් රැඳීමි. උන්වහන්සේ විසින් / සතුට මා කරුණාවෙන් සලකා බලා ඔබ බාල පුතාව ශාසනයට සුදුසු යැයි සලකා, දිය හැකි ලොකුම ප්‍රිය, දය වශයෙන් සලකා මහණකම දීමට තීරණය කොට ඇත. ඒ තීරණය අනුව මම පූජා පුතා බලා සිටි ඒ උතුම් විනයකර්මය මේ අවුරුද්දේ නොවැම්බර් මස මැදදී (15, 16 දිනවල) සිදුකරන බව ලියා දන්වන මේ ලිපිය කියවා ලැබෙන සතුටින්, [illegible], සමාදන්ව උතුම් වූ නිවන සුවය මේ ආත්මභාවයේදීම ලබාගැනීමට ප්‍රාර්ථනා කළ යුතුයි.

ඉන් කලින් [illegible] අයත් මේ පින්බර පැවිද්ද ලබාදීමෙන් [illegible] ඔබටත් උතුම් වූ නිවන් කරගැනීමට අවස්ථාව ලැබෙන්නේ හොඳ මෛත්‍රියෙන් ඉල්ලා සිටිමි

නිවන් මඟටම යොමුවේවා සිත් !

මෛත්‍රියෙනි

පැවිදි වීමට ලද අවස්ථාව පිළිබඳව මවට දැනුම් දුන් ලිපිය



කුඩා කල
(කරුණාරත්න බණ්ඩා)



තරුණ අවදියේ දී..

පැවිදි වීමට පෙර
මව සමග

විපිතපුර දුටුගැමුණු ආරණ්‍ය සේනාසනයේ සීමා මාලකයේ දී

2019 ඔස්ට්‍රේලියාවේ සිඩ්නි නුවර සතිපාසල් කඳවුරේ දී

ඇත. ඒ අනුව ඉදිරි අධ්‍යාපන හා විෂයමාලා සංවර්ධනයේ සමාජ හා චිත්තවේගීය ඉගෙණුම් (Social and Emotional Learning) යටතේ පාසැල් දරුවන් සඳහා සතිමත් බව පුහුණුවීම සඳහා අවශ්‍ය ඉගෙණුම් ද්‍රව්‍ය (Teaching Material) සකස් වෙමින් පවතී. ඉදිරි පාසැල් වාරයේදී මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක වීමට නියමිතය. ඒ පිළිබඳව ඉදිරියේදී ධනාත්මකව හා සතුටුදයක අන්දමින් කථාකිරීමට හැකිවන බවට පාසැල්වලදී ලද අත්දැකීම් සාක්ෂි දරයි.

ජන මාධ්‍ය විසින් හසුරුවන වර්තමාන සමාජයේ තමාගේ වැඩසටහනක් හෝ තමා පුද්ගලිකව ජනප්‍රිකර ගැනීම සඳහා මාධ්‍යයේ පිහිට පැතීම හා මාධ්‍ය කරුවන් පසු පස යාම සුලභ දර්ශනයකි. අති පූජනීය ධම්මජීව හිමියන් නිහඬව, සෙමින්, නිවැරදි සිහියෙන් යුතුව, තම කටයුත්ත අඛන්ඩව කරගෙන ගියා මිසක, කිසි දවසක ජනමාධ්‍ය පසුපස ගියේ නැත. සත්‍ය වශයෙන්ම එම හිමියන් සමහර මාධ්‍යයන් මඟින් කරනු ලබන අකටයුතු දැක, ඒවා ජඩමාධ්‍ය ලෙසින් හැඳින්වීමට පසුබට වූයේ නැත. එහෙත් අදවන විට සති පාසැල සංකල්පය සමාජ ගතවීමේ ප්‍රවනතාවය හා එමඟින් සිදුවන සමාජ බලපෑමේ සීඝ්‍රතාවය නිසාම සියළුම ජනමාධ්‍යයන් අති පූජනීය ධම්මජීව හිමියන් පසුපස වැටී ඇත. මෙම අවස්ථාව මැදහත් සිතින් ඉවසමින් සති සංකල්පයේ අඛණ්ඩ ව්‍යාප්තිය සඳහා මාධ්‍ය මැදිහත්වීම භාවිතා කරනවා විනා කිසිම අයුරකින් ජනමාධ්‍ය මත යැපීමක් බලාපෙරොත්තු නොවන බව පෙන්වා දෙන්නේ බොහෝ දෙනෙකුට ආදර්ශයක් ලෙසින්ය.

11. කූටප්‍රාප්තිය

සති පාසැල පිළිබඳ මෙම සාර්ථකත්වය, අති පූජනීය ධම්මජීව හිමිපාණන් වසර හතලිහකට ආසන්න කාලයක්, ප්‍රායෝගිකව, අඛණ්ඩව, සතිපට්ඨානය වඩමින්, ගොඩනගන ලද ධර්මමය චෛත්‍යයේ කොත හා චූඩාමණික්‍යා පැළඳවීමට සමාන යයි කීම අතිශයෝක්තියක් නොව යථාර්තයක්ම යයි පිළිගැනීමට අති පූජනීය ධම්මජීව හිමියන්ගේ ප්‍රායෝගික හා සරල ජීවන පැවත්ම ගැන දන්නා සියලුදෙනාම කැමති වනු ඇත.

නිමි.

පසු වදන

මෙම රචනය ලිවීම ආරම්භ වූයේ ශාක්ෂාත් කළ යුතු දහම් කඳු පහ නමින් පළවන පොතට පෙරවදනක් ලෙසය. අති පූජනීය ධම්මජීව හිමිපාණන්ගේ ධර්මාවබෝධ ඥාණය හා භාවනා අත්දැකීම් විස්තර කිරීමට උත්සහ කිරීමේදී රචනය දීර්ඝ විය. ධම්මජීව හිමියන්ගේ චරිතයම පුද්ගලත්වය ඉක්මවා යන ධර්ම පරම්පරාවෙන් පිරී ඇත. එනිසා එම චරිතය දෙස බැලිය යුත්තේ ධර්ම පරම්පරාවක් දෙස බලන ආකාරයෙන් යයි අත්දැකීම අනුව විශ්වාශ කරමි. එනිසාම එවැනි උතුම් චරිතයක් පිළිබඳව සටහනක් ලියා තැබීම අනාගත පරපුරට ආදර්ශයක් වනු ඇතැයි සිතමි.

ස්වාමීන් වහන්සේගේ ගිහිකාලය පිළිබඳ තොරතුරු සපයා දුන් පේරාදෙණිය සුබෝධාරමයේ සති කණ්ඩායමට හා සමකාලීන සරසවි මිතුරු කැලට ස්තුතිවන්ත වෙමි. අත් පිටපත කියවා රචනයේ ගුණාත්මක බව දියුණු කරගැනීම සඳහා උපකාර කළ දයිකාවට ද ස්තුතිවන්ත වෙමි. මෙම රචනයට පෙරවදනක් සපයා දීමෙන් හා මුද්‍රණ කටයුතු සම්බන්ධීකරණයෙන් සහය වූ නිස්සරණ වන සේනාසන සංරක්ෂණ මණ්ඩලයේ සම ලේකම් හේමන්ත රණවක මහතාටද කෘතඥ්ඥ වෙමි. මුද්‍රණ කටයුතු මනාව කරදුන් කොලිටි ප්‍රින්ටර්ස් ආයතනයටත් එහි කාර්ය මණ්ඩලයටත් ස්තුතිවන්ත වෙමි.

මෙම රචන ලිවීම සඳහා අත්‍යාවශය වූ විවේකය සහිත නේවාසික පහසුකම සපයා දුන් සති පාසල පදනමේ භාවනා උපදේශක පූජනීය අතුරුගිරියේ ධම්ම විහාරී හිමියන්ටද පුණ්‍යානුමෝදනා පූර්වක ස්තුතිය පුදකරමි.

පූජ්‍ය බන්ඩාරවෙල සද්ධාතිස්ස හිමි.
දු.ක. 0702598264 / urti2004@yahoo.com
සතිපාසල පරිශ්‍රය
කඩුවෙල.

සීහෝ’ව සද්දේසු අසන්ත සන්තෝ
වාතෝ’ව ජාලම්හි අබද්ධමානෝ
පදුමංච තොයේ’ව අලිම්පමානෝ
ඒකෝ’චරේ කග්ග විසාන කප්පෝ.

සද්දයෙන් සන්ත්‍රාසයට පත් නොවන සිංහයකුසේද
දැළෙහි නොරැඳන වාතය සේද
දියෙහි කිළුටු නොවන නෙළුම සේද
එක් අඟක් ඇති කඟවේනා සේ තනිව හැසිරේ.

රු.65/-

ISBN:978-624-5512-15-7
9 786245 512157

කොලිටි ප්‍රින්ටර්ස් - 0112 809 499